# බුදුසරණ


ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ පොසොන් පුර අටවක පෝ ද, 2021 ජුනි 18 සිකුරාදා BUDUSARANA FRIDAY JUNE 18, 2021

55 කාණ්ඩය, 51 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 12






# සුව අහරින් සවිය වඩමු සවි බලයෙන් දැය නංවමු

**ආහාරයෙහි අවශ්‍යතාව පාට, ලිංග, ජාති, භේදයකින් තොරව සැමට පොදු වූවකි. "සබ්බේ සත්ථා ආහාරට්ඨිතිකා" ලෙස බුදු දහම දක්වන්නේ එහෙයිනි. ගිහි පැවිදි භේදයකින් තොරව සියල්ලෝට ම ශක්තිය බලය අවශ්‍ය වන අතර එය ලැබිය යුත්තේ ආහාර තුළිනි. ආධ්‍යාත්මික ජීවිතය මෙන්ම භෞතික ජීවිතය වඩා අර්ථවත් ව පවත්වා ගැනීමට සමබල ආහාර වේලක් අවශ්‍ය ය. බුදු දහමෙහි ඉගැන්වෙන සේඛියා තුළින් සිදුකරනුයේ ද ආහාර රටාව හා ජීවන රටාව ක්‍රමවත් කිරීම ය.**

සඟරුවනට පිණ්ඩපාතය අනුදැන වදරන්නේත්, ඇතැම්විට ධර්මය දේශනා කිරීමට පෙර දායකයන්ට ආහාර ලබාදෙන ලෙස බුදුරදුන් නියම කරන්නේ ද ආහාරයෙන් තොර ශක්තියක් නොමැති නිසාවෙනි. මේ ලෝකයෙහි ඇති දරුණු ම රෝගය ලෙස බුදුදහම බඩගින්න හඳුන්වා ඇත්තේ ද ආහාරයෙහි අවශ්‍යතාව අනිවාර්ය බැවිනි. පොදුවේ ගත් විට ආධ්‍යාත්මික මෙන්ම භෞතික දියුණුව විෂයෙහි ආහාර අත්‍යවශ්‍ය ය. මන්ද යත් ආහාරයෙන් තොර ශක්තියක් නොමැති බැවිනි.

## පමණ දැන ගැනීම

ආහාරයෙහි පමණ දැන පරිභෝජනයෙහි සීමා හඳුනා ගැනීම අවශ්‍ය ය. ආහාර අවශ්‍ය වන්නේ සවිය හෙවත් ශක්තිය ලබා ගැනීම සඳහා ය. ඒ සඳහා ගිජුබවක් නො දැක්විය යුතු ය. ආහාරයෙහි ගිජුවීම නිසා ශරීරයේ සමබරතාව පවා ගිලිහීයාම අනිවාර්ය ය. කොසොල් රජුට සිදුවූයේ එවැනි තත්ත්වයකි. බුදුරදුන්ගේ මඟ පෙන්වීම මත එයින් අත් මිදීමට ඔහුට හැකියාව සැලසුනි. තමා ශක්තිය ලබා ගැනීමට ගනු ලබන ආහාර තම ආයුෂ කෙටිවීමට හේතු වන්නේ නම් එවන් ආහාර රටාවක් බුදු දහම අනුමත නො කරයි.

බුදුදහම දේශනා කරන අරියවංස, රාසිය හා කාමභෝගී යන සූත්‍ර තුළ ඉහත දැක් වූ පරිභෝජන දර්ශනය මනාව විස්තර කරයි. ආහාර පරිභෝජනයේ දී විමසුම් සහිතව පරිමාණය දැනීම අවශ්‍ය ය. මුළාව, දැඩි ඇල්මෙන් එය නො ගත යුතු ය. එසේම උතුම් ජීවිත පවත්වා ගැනීමේ අරමුණ සහිතව ආහාර අනුභවය සිදුකළ යුතු වේ. එසේ නොමැති වූ විට සිදුවනුයේ පරිහානියකි. අටුවා එය විස්තර කරනුයේ පැණි හැලියට වැටුණු ඇඹලයාට ය. එසේම ආදීනව දැන ගනිමින් ආහාරය ලබා ගැනීම අවශ්‍ය ය.

ආහාර ඉහත සීමා අනුගමනය කරමින් ලබන්නේ නම් එය කාර්යක්ෂම හා ඵලදායී පිරිසක් නිර්මාණය කිරීමෙහි වැදගත් ය. එවිට අඩු ශ්‍රමයකින් වැඩි වාසි සලසා ගැනීම පහසු වේ. පළමු රහත් 60 නම අමතා බුදුරදුන් අනුගමනය කරනුයේ මේ තත්ත්වය යි. එනම් පිණ්ඩපාතයෙන් යැපීම තුළ බොහෝ පිරිසකට ධර්ම දායාදය ලබා දීමයි. "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය..." යන පාඨයෙන් එය වඩාත් හඳුනා ගත හැකි ය.

## නොකා නොබී මිය යෑම

රටක් ජාතියක් ලෙස ශක්තිමත් ව කටයුතු කිරීමේ දී සමබල ජීවිතය වැදගත් වේ. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී 'සමජීවිකතා" ලෙස සඳහන් වන්නේ එම තත්ත්වය යි. අයවැය සමව පවත්වා ගැනීම පරිභෝජනයේ දී ඉතා වැදගත් ය. "අණන සුඛය" හෙවත් ණය නොවී පැවතීම බුදු දහම නිරන්තරව අගය කරයි.

සමජීවිකතාවට විරුද්ධ සහ නො ගැළපෙන අන්ත දෙක වනුයේ "අජද්ධුමාරිකා" හෙවත් නොකා නොබී මිය යෑම හා "උදුම්බරඛාදිකා" හෙවත් අතුකපා දිවුල් කන්නා සේ භුක්ති විඳීම යි. මෙම අවස්ථා දෙකම තුළ නිවැරදි භාවයක් නොමැත.

මේ ජීවිතය තුළ දියුණුව ඇතිවීම විෂයෙහි කරුණු හතක් අවශ්‍ය බව ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේ ම සඳහන් ය. එය සම්පූර්ණ නො වන විටදී ශක්තිමත් ජාතියක් බිහි නොවේ. එම කරුණු හතර මෙසේ ය.

උට්ඨාන සම්පදාව – උත්සාහය
ආරක්ඛ සම්පදාව – ආරක්ෂාව
කල්‍යාණමිත්තතාව – කල්‍යාණ මිත්‍රත්වය
සමජීවිකතාව වශයෙනි.

උත්සාහය මහන්සිය මෙන්ම ලබන ලද ධනය ආරක්ෂා කර ගත යුතු ය. ඒ සඳහා යහපත් සමාජ සම්බන්ධතා අවශ්‍ය වේ. ඒ මත අය වැය තුලනය කරගත් ජීවිතය ගත කිරීම අපහසු නොවේ. මෙහිදීම කරණීයමෙත්ත සූත්‍රයේ දී දක්වනු ලබන සුභරතා, අප්පිච්චිතා, සන්තුට්ඨිතාව අමතක කළ නොහැක. මන්දයත් පරිභෝජනයේ දී සම්පත් සීමිත අතර, මිනිස් අවශ්‍යතා අසීමිත වේ. අසීමිත වුවමනාවන් ඉටුකර ගැනීමට යෑමේ දී ගැටුම් ඇතිවේ. එහෙයින් ලද දෙයින් සතුටු වීම මෙන්ම පහසුවෙන් පෝෂණය කිරීමටට හැකියාව තිබීම වැදගත් ය.

පරිභෝජනය අවබෝධයෙන් සිදුකළ යුතු ය. ජීවිත ක්‍රියාවලියේ අවසානය පරිභෝජනය නොවේ. මිනිස් ක්‍රියාකාරීත්වයේ අවසාන අරමුණ ආහාර නොවේ. පරිභෝජනය කරන ප්‍රමාණය මත උස් පහත් බව මැනිය නොහැක. උස් පහත් බව මැනෙනුයේ ආහාරයෙන් ලද ශක්තිය දියුණුව විෂයෙහි යොදා ගන්නා ප්‍රමාණය මත ය.

## ශ්‍රේෂ්ඨත්වය ලැබෙන හැටි

ශ්‍රමය කැපකිරීමට අවශ්‍ය ශක්තිය ආහාරයෙන් ලැබේ. එහෙයින් ශ්‍රමය කැප නොකර අන් අයගෙන් යැපීමට උත්සාහ කිරීම පිරිහීමට හේතුවේ. දියුණුව හෝ පරිහානිය මත එකිනෙකාගේ ශ්‍රේෂ්ඨත්වය පවතී. විවිධ වෘත්තීන් හා ක්‍රියාකාරකම් සිදුකරමින් පවතින බොහෝ පිරිසක් මේ මිහිපිට ඇත. ඒ සෑම කාර්යයක දීම වඩාත් ඵලදායීව පෞද්ගලික අරමුණු හා ජාතික අරමුණු ජයග්‍රහණය කළ යුතු ය. (කෘෂිකර්මය, වෙළඳාම, රාජ්‍ය සේවය, නිෂ්පාදනය) යන ඕනෑම ක්ෂේත්‍රයකට ඉහත කාරණාව පොදු ය. මෙම කාර්යයන් විධිමත් ව සංවිධානය කළ යුතු ය. වැඩි ඵලදාවක් ලැබෙනුයේ එවිට ය. එය ක්‍රියාවට නැංවීම පිළිබඳ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී බුදුදහම පැහැදිලි කරයි. එහිදී කරුණු පහක් මෙසේ විස්තර කකරයි.

දක්ඛෝ – දක්ෂවීම
අනලසෝ – කම්මැළි නොවීම
තත්‍රූපාය විමංසාය –
ඒ ඒ අවස්ථාවන්ට බුද්ධිමත් වීම
අලංකාතුං –
කළ යුතු දේ මනාව සිදු කිරීම
අලංසංවිධාතුං –
මනාව සංවිධානය කිරීම

## සුදුස්සෝ නොවෙත් නම්

ඕනෑම කාර්යයක් වඩා සාර්ථකවීමට හා ඉන් වැඩි ඵලය ලැබීමට කාර්යයෙහි නියුක්තවන්නන් දක්ෂ විය යුතු ය. යමක් කිරීමට නොව වඩා හොඳින් සිදුකිරීම අවශ්‍ය ය. ආයතනයක් නම් ඒ සඳහා සුදුසු පිරිස් පත් කරගත යුතු අතර සුදුසු අය නැත්නම් පුටුව හිස්ව තැබීම නුසුදුසු අය පත් කරනවාට වඩා සුදුසු ය. ආයතනයන්හි කළමනාකාරීත්වය මේ පිළිබඳ සැලකිලිමත් වීම වැදගත් ය. දක්ෂ භාවය සමඟම අනලස්භාවය අවශ්‍ය ය. පිරිහීමේ දොරටු අතර ද අලසකම එකකි.

ධන විනාශය එක් විනාශ මුඛයකි. ඇතැම් අලසයන් කෑම අඩුය, දැන් බඩපිරී වැඩිය සිතා තම ශක්තිය අපතේ හරී යි. එහෙයින් අනලස්ව ලබන වේතනයට සරිලන සේවාවන් සිදුකිරීමට වගබලා ගත යුතු ය.

විමසිලිමත්වීම හෙවත් ඒ ඒ අවස්ථාවන්ට ගැළපෙන ලෙස බුද්ධිමත්වීම තවත් ප්‍රධාන කාර්යයකි. එසේ නොමැති වූ විට සම්පත් අපතේ යාම හා වැඩි කාලයක් භුක්ති විඳිය හැකි සම්පත් ඉක්මණින් විනාශ විය හැකි ය. එය එසේ නො වීමට නම් අවස්ථාවට අනුරූපව බුද්ධිය මෙහෙයවීම වැදගත් වේ.

වඩා අර්ථවත් ක්‍රියාකාරකම් සඳහා ශක්තිය කළමනාකරණය කරගනිමින් යෙදවීම වැදගත් ය. වඩා ඉක්මණින් කළයුතු දෑ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු ය. කාර්යක්ෂමතාව පමණක් වැදගත් නොවේ. ඵලදායීතාවක් අවශ්‍ය ය. එය දීර්ඝ කාලීන විය යුතු ය.

එදා වේල ගැන පමණක් සිතීම කළ යුතු දේ තෝරා ගැනීම නොවේ. කරන සෑම කාර්යයක්ම ආර්ථික ලාභය පමණක් ඉලක්ක කර ගැනීම දියුණුව ලෙස අරුත් ගැන්විය නොහැක. සදාචාරයට, පරිසරයට, මිනිස් පැවැත්මට අවැඩදායක ක්‍රියාකාරකම් තුළින් ඉවත්විය යුතු ය. යෝග්‍ය සුදුසු කටයුතු තීරණය කර තෝරා ගැනීම අවශ්‍ය ය. එවිට ඇතිවන දියුණුව තිරසාර වේ.

## වටිනාකම් හඳුනාගනිමු

මනාව කටයුතු සම්පාදනය කිරීම මෙහිදී අවධාරණය කරන අවසාන කාරණය යි. ඒ සඳහා භෞතික කාරණා මෙන්ම මිනිස් දිනචරියාව හැඩ ගස්වා ගන්නා ආකාරය වැදගත් වේ. බුදුරදුන් 45 වසරක් වැනි කෙටි කාලයක් තුළ ගොඩනැගූ ශාසනය 2600 වසරක් ම නො නැසී පැවතීමේ රහස ද එයම ය. උන්වහන්සේ තුළ භික්ෂූන් වහන්සේ හැසිරවීමේ මනා නිපුණත්වය හා වැඩ බෙදීම සරලම උදාහරණය වේ. වර්තමානයේ සම්පත් කළමනාකරණය ලෙස දක්වනුයේ එම තත්ත්වය යි. පුද්ගලයන් සතුටු කිරීමට නොව රැකියාවට අවශ්‍ය පුද්ගලයකු තෝරාගැනීම මනා සංවිධානය යි. සෑම කාරණාවකට ම මිල නියම කිරීමෙන් පමණක් සෑහීමකට පත්නොවිය යුතු ය. භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් පිළිබඳ වටිනාකම හඳුනාගත යුතු ය.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# බෞද්ධ ධර්ම දූතයෝ

පොසොන් පුර අටවක පෝය

## දම් දෙසුම

**මහණෙනි, බහු ජන හිත සුව පිණිස ලෝකයා කෙරෙහි කරුණාවෙන් සියලු දෙව් මිනිසුන් ගේ හිත සුව පිණිස සැරි සරන්න. - මහා වග්ගපාලි**

**බුදු සමය පිළිබඳ ඉතිහාසයේ පිටු පෙරලන විට බෞද්ධ ධර්ම දූතයන් වහන්සේලා බුදුරදුන්ගේ අති උත්තම දහම් පණිවුඩය සාමකාමී ව, ගෞරවාන්විත ව බෙදුදුන් හැටි අපට පෙනේ. තම ආගම් ප්‍රචාරයට බිහිසුණු ක්‍රම භාවිත කළ අයට එම සාමකාමී දූත මෙහෙය ලජ්ජාවට කාරණයක් විය හැකි ය.**

බෞද්ධ ධර්ම දූතයෝ (සෙසු ආගමික දේශකයන් හා) මිනිසුන් සිය සමයට හරවා ගැනීමට ගම් නියම් ගම්වල දීතරඟ නොවැදුනාහ. තම සමය විශ්වාස නො කරන්නවුනට වෛර කිරීමක් බෞද්ධ ධර්මදූතයන් කිසි දිනෙක නො සිතන්නකි. ආගමික සංස්කෘතික හා ජාතික ගති නො ඉවසීම අබෞද්ධ ආකල්පයකි. සැබෑ බෞද්ධ ගතිය පෙවුණු ජනතාව විශේෂ වූහ.

බුද්ධ දේශනාවේ අනුමැතිය කිසි දිනෙක ආක්‍රමණය සඳහා නොලැබෙන්නේ ය. මේ ලෝකය ඇති තරම් ලේ වගුරුවා, හැකි තරම් පීඩා විඳ ඇත්තේ ආගමික මති මතාන්තර පිළිබඳ රෝගයෙනි. ආගමික උමතුවෙන් හා ආගමික අසහනයෙනි. ආගම පිළිබඳව හෝ වේවා, දේශපාලනය පිළිබඳව හෝ වේවා, මිනිසුන් දැන දැනම ප්‍රයත්න දරන්නේ මානව වර්ගයාට තම තමන් රුචි කරන ජීවන මාර්ග පිළිගැන්වීමට ය. එසේ කරමින් ඔවුහු ඇතැම් විට සෙසු ආගමික අනුගාමිකයනට විරුද්ධවාදීකම් දක්වති. බුදු සමයත් බුදු සමය වැළඳගත් අයගේ සංස්කෘතියත් අතර කිසිදු අවුලක් හෝ ගැටුමක් ඇති නොවී ය.


මක්නිසාද යත්? ජාතික සම්ප්‍රදායයන්, සිරිත් විරිත්, කලා ශිල්ප හා සංස්කෘතීන් ඈ යමක් ජනතාව පිළිගෙන තිබිණි නම් ඒවා තව දුරටත් පණ පෙවී හැඩ ගැසී පැවතීමට මහත් සේ ඉඩකඩ ලැබුණු නිසා ය.

බුදුරජාණන් වහන්සේගේ සාමයේ පණිවුඩය මිනිසුන්ගේ හදවත් විවෘත කෙළේ ය. ජනතාව විසින් කැමැත්තෙන් ම බුදු දහම පිළිගනු ලැබී ය.

ඒ අනුව බුදු සමය ලෝක ආගමක් වූයේ ය. ස්වාධීන රාජ්‍යයන් විසින් බෞද්ධ ධර්ම දූතයනට ආරාධනා කර ඔවුහු මහත් බැතියෙන් පිළිගනු ලැබූහ. බුදු සමය කිසිදු රටකට යටත් විජිත බලපෑම් හෝ දේශපාලන ශක්තිය මත හෝ ඉදිරිපත් නො කෙරිණි.

බුදු සමය, පළමු වැනි ආධ්‍යාත්මික බලවේගය ලෙස ඉතිහාසයේ දක්නට ලැබෙන්නේ විශාල ජාතීන් ඇති, දුෂ්කර බාධක වලින් වෙන් වූ, දුරස්ථ වූ, භාෂාව, සිරිත් විරිත්, සංස්කෘතිය අතින් වෙනස් වූ රටවල් සමීප කිරීමට සමත් වූ නිසා ය. එහි අරමුණ වූයේ අන්තර් ජාතික වෙළෙඳාම අයත් කර ගැනීම, ආශාවන් සපුරා ගැනීම, නොවේ. එහි පරමාර්ථය වූයේ ජනතාවට ආගම භාවිතයෙන් වැඩි සාමයක්, සතුටක් ලබා ගත හැකි ක්‍රමය පෙන්වාදීම ය.

අශෝක අධිරාජයා බෞද්ධ ධර්මදූත මෙහෙයේ තත්ත්වය හා ප්‍රවේශයට ඇති දිදුලන නිදර්ශනයකි. බොහෝ පෙරදිග හා අපරදිග රටවලට ධර්මදූත මෙහෙය පැතිර ගියෝ අශෝක අධිරාජයන් දවස ය. අශෝක මහ රජු බුදුරදුන්ගේ සාම පණිවුඩය බොහෝ රටවලට ඉදිරිපත් කෙළේ ය. එතුමා සියලු ආගම්වලට ගෞරවය දැක්වූයේ ය. නොමසුරුව ආධාර දුන්නේ ය. අන්‍ය ආගම ඉවසීම එතුමාගේ විශේෂ ලක්ෂණය වූයේ ය.



කිරින්දේ ශ්‍රී ධම්මානන්ද නා හිමි

අශෝකස්තම්භයක ලියන ලද එතුමාගේ එක් ලිපියක් අදත් ඉන්දියාවේ නැඟී සිටිමින් මෙසේ කියයි.

'කෙනෙකු තම ආගමට පමණක් ගෞරව නො කළ යුතු ය. සෙසු ආගම්වලට ගර්හා නොකළ යුතු ය. නමුත් මොන හේතුවක් නිසා හෝ අන්‍ය ආගම්වලට ද ගෞරව කළ යුතු ය. එසේ කරමින් කෙනකු තම ආගමට ආධාර දෙන අතර අනුන්ගේ ආගම්වල වර්ධනයට ද සේවාවක් කළ යුතු ය. එයට විරුද්ධ ව කටයුතු කරන්නෝ තම ආගමේ මිනීවළ කපන්නෝ ය. අන්‍ය ආගම්වලට ද හානි පමුණුවන්නෝ ය. කිසියම් කෙනකු තම ආගමට ගරු කරමින් සෙසු ආගම්වලට නිගරු කරන්නේ ද එසේ කරන්නේ තම ආගමට ඇති භක්තිය නිසා "මම මගේ ආගම ප්‍රභාවත් කරමි'යි සිතීමෙනි. එහෙත් එයට ප්‍රතිපක්ෂව එසේ කිරීමෙන් ඔහු ඔහුගේ ආගමට තදබල ලෙස හානි කෙරෙයි. එබැවින් එකඟත්වය යහපත් ය."

සියලු දෙන අසත්වා. අන්‍යයන් අදහන ආගම ධර්මයට ද සවන් දීමට කැමැති වෙත්වා."

ක්‍රි.ව. 283 දී බුදුරදුන් ගේ ධර්මය ඉන්දියාවේ සජීවී බලවේගයක් බවට එතුමා පත් කෙළේ ය. ආරෝග්‍යශාලා, සමාජ සේවා ආයතන, ස්ත්‍රී පුරුෂයන් සඳහා විද්‍යාස්ථාන, ළිං පොකුණු විනෝද මධ්‍යස්ථාන ආදිය නව ව්‍යාපාරය අනුව රට පුරා පැන නැඟිණි.

අර්ථ විරහිත යුද කල කෝලාහල වල කෲරත්වය මිනිසුනට වැටහී ගියේ ය. ඉන්දියාවේ හා සෙසු රටවල ඉතිහාසයේ රන් යුගය සේ සැලකෙන්නේ කලා ශිල්ප සංස්කෘතිය හා ශිෂ්ටාචාරය මුදුන් පෙත්තට ම ළඟා වූ විට ය. එ සේ සිදු වූයේ බෞද්ධ බලපෑම් ශක්තිමත්ව පැවැති රටවල හා එම වකවානුවල ය.

මානව වර්ගයාට උඩඟු විය හැක්කේ එවැනි ඉතිහාසයකට ය. නාලන්ද මහා විශ්වවිද්‍යාලය ඉන්දියාවේ පැවැතියේ ක්‍රිව. දෙවන සියවසේ සිට නව වැනි සියවස දක්වා ය. එය බුද්ධ ශාසනයේ නිෂ්පාදනයකි. අප දන්නා පළමු විශ්වවිද්‍යාලයත්, අන්තර් ජාතික ශිෂ්‍යයනට විවෘත වූ විශ්ව විද්‍යාලයත් එයම ය.


අතීතයේ පෙරදිග බොහෝ රටවලට බුදු සමය කුමක්දැයි දැන ගැනීමට සැලැස්වීමේ හැකියාවක් තිබිණි. සන්නිවේදනය හා ප්‍රවාහනය ඉතා දුෂ්කර වුව ද මිනිසුනට කඳු හෙල් මරු කතර හරහා යැමට සිදු වූ වද, එකී දුෂ්කරතා නො සලකා බාධක මැඩගෙන බුදු සමය දිගට හරහට පැතිරී ගියේ ය. අද මේ සාම පණිවුඩය බටහිරට ද පැතිරේ. අපර දිග රටවල බුදු සමයට ඇළුම් කරන්නේ නූතන විද්‍යාව හා සංගත වන්නේ බුදු සමය පමණක් බැව් විශ්වාස කරන නිසා ය.

බෞද්ධ ධර්ම දූතයෝ යම් කිසි තේරුමක් ඇති ආගම් ඇදහූ මිනිසුන් තම ආගමට හරවා ගැනීමට එතරම් ආශාවක් හෝ අවශ්‍යතාවක් නොපෙන්වූහ. එකී ජනයා ඔවුන්ගේ ආගමින් තෘප්තිමත් ව සිටිත් නම් බෞද්ධ ධර්ම දූතයනට එවැනි අය තම ආගමට හරවා ගැනීමට එතරම් ආශාවක් හෝ අවශ්‍යතාවක් නොපෙන්වූහ. එකී ජනයා ඔවුන්ගේ ආගමින් තෘප්තිමත් ව සිටිත් නම් බෞද්ධ ධර්ම දූතයනට එවැනි අය තම ආගමට හරවා ගැනීමට අවශ්‍යතාවක් නො වීය. ඔවුහු සෙසු ධර්ම දූතයන්ට ද පූර්ණ සහයෝගය දුන්නේ ඒ අය නපුරු පව්වු නො දමුණු ජනයාට ආගමානුකූල ජීවිතයක් ප්‍රගුණ කිරීම් වස් කරන සේවාවට සහයෝගය දීමට ය.

බෞද්ධයෝ සෙසු ආගම්වල ප්‍රගතිය ද දකිනු රිසියෝ ය. යම්තාක් දුරට සැබෑ ලෙසින් ජනතාවට ඔවුන්ගේ ආගම අනුව ආගමික ජීවිතයකට යොමුවීමට ආධාර කරතොත් එසේ ම ඔවුහු සාමයෙන් සතුටෙන් ස්වාවබෝධයෙන් සංගතව සිය ජීවිත ගෙන යති. ඒ තාක් දුරට අන්‍ය ආගමික දේශකයනට ද සහයෝගය දෙති.

අනික් අතට ඇතැම් ධර්ම දූතයෝ අන්‍ය ආගමික අනුගාමිකයනට තම තමන්ගේ ආගම් ඇදහීමට බාධාකර වෙනත් ආගමකට හරවා ගැනීමට කරන සටන හෙළා දකිති. මිනිසුනට ආගමික ජීවිතයක් ගෙන යන සැටි කියා දීමේ පරමාර්ථයෙන් ධර්මදූත මෙහෙයේ යෙදෙන විට ආගම්වලට හරවා ගැනීමේ තරඟයක්, අසුබදායක වාතාවරණයක් ඇතිවීමට හේතුවක් නො මැත. අන්‍යයනට බුදු සමය ඉදිරිපත් කිරීමේ දී බෞද්ධ ධර්ම දූතයෝ කිසි රටෙක දිව්‍ය සම්පත් අතිශයෝක්තියෙන් කාල්පනික ලෙස ඉදිරිපත් නො කළහ. මක්නිසාදයත්? එසේ කිරීමෙන් මානව ආශාවන් ආකර්ශණය කරවා තණ්හාව පුබුදු කරවන හෙයිනි. ඒ වෙනුවට බුදුරදුන් වදාළ පරිදි මනුෂ්‍ය ජීවිතය සහ දිව්‍ය ලෝක ජීවිතය පිළිබඳ යථා තත්ත්වය පැහැදිලි කරදීමට ප්‍රයත්න දැරූහ.

**(බෞද්ධ විශ්වාස විමර්ශන කෘතියෙනි)**



මීළඟ බුදුසරණ කලාපය පොසොන් පුර පසළොස්වක ජුනි 24 බ්‍රහස්පතින්දා

# උත්තරීතර පැවිදි දිවියක පූජනීයත්වය



උදාර පැවිදි දිවියක පියසටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ අමරපුර සිරිසද්ධම්මවංශ පාර්ශ්වයේ අනුනායක ධූරන්ධර ආචාර්ය දිමියාවේ අමරවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**කෙළිදෙළෙන් ගත කරන ළමා වියේදී ම පැවිදිවීමට සිත් දුන්නේ කුමන ආකාරයෙන් ද? අපේ හාමුදුරුවනේ,**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දිමියාව ග්‍රාමයේ දිමියාව චන්ද්‍රසේකරගේ කරුණාරත්න සහ කහංගමගේ පොඩිහාමිනේ යන දම්පතීන් දෙපළ සදාදරණීය මව්පියන් කොට දරුවන් නව දෙනකුගෙන් යුත් පවුලක අටවැනි දරුවා ලෙස ජන්ම ලාභය ලැබුවා.

දිමියාව රජයේ පාසල තුළින් මූලික අධ්‍යාපනය ලබන කුඩා අවධියේ සිටම ගමේ විහාරස්ථානය සමඟ ඉතා සමීපව කටයුතු කළා. එනිසාම ගමේ විහාරස්ථානයේ නායක හාමුදුරුවන් වහන්සේ මාව පැවිදි කිරීමට ඉල්ලුවත් මම බාල දරුවා නිසා අම්මා එයට කැමැති වුණේ නැහැ. මොරටු පළාතේ ප්‍රධාන සංඝ නායක මොරටුවේ සිරි ශාසනවංශ නායක ස්වාමීන් වහන්සේ සමඟ මගේ මහප්පා ඉතා සමීප ඇසුරක් තිබුණ නිසා 1947 වර්ෂයේදී මා මොරටුමුල්ල සද්ධර්මරාජ මහා විහාරස්ථානය වෙත කැඳවාගෙන ආවා.

අමරපුර සිරිසද්ධම්මවංශ මහානිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෙස වැඩ සිටි මාපලානේ සිරි පඤ්ඤාලංකාර මහානායක හාමුදුරුවන් වහන්සේ, රාජකීය පණ්ඩිත තෙල්වත්තේ පඤ්ඤාවංශ අනු නායක හාමුදුරුවන් වහන්සේ යන දෙනමගේ උපාධ්‍යායත්වයෙන් 1948 වර්ෂයේ දෙසැම්බර් මස 22 වනදින සම්මා සම්බුද්ධ ශාසනයේ උතුම් පැවිදි භාවයට පත්වුණා.

**ඔබ වහන්සේ ශාසනික අධ්‍යාපනය වගේම උසස් අධ්‍යාපනය ලබාගත් කාල පරිච්ඡේදය සිහිපත් කරනවා නම්,**

1951 වර්ෂයේදී ජනවාරි 31 වනදින මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනට ඇතුළත්ව එවකට පරිවේණාධිපතිව වැඩ සිටි බද්දේගම පියරතන නායක හාමුදුරුවන් වහන්සේ වගේ ම වැලිවිටියේ සෝරත නා හිමියන්, කළුකොඳයාවේ පඤ්ඤාසේකර නා හිමියන්, වැලිවිටියේ පේමරතන නා හිමියන්, ගලගම සරණංකර නා හිමියන්, රද්දැල්ලේ පඤ්ඤාලෝක නා හිමියන් ආදී මහා උගත් යතීන්ද්‍රයන් වහන්සේලා යටතේ ඉතාමත් සාර්ථකව අධ්‍යයන කටයුතු සිදුකිරීමේ භාග්‍ය උදා කරගත්තා. එම කාල වකවානුවේදීම තිසි වයස් සම්පූර්ණවීමත් සමඟ 1956 වර්ෂයේ ජූනි 16 වෙනි දින පානදුරානදී උදකුක්ඛේප සීමාමාලකයේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදා පුණ්‍යකර්මය සිදු කළ බවත් සිහිපත් කළ යුතුයි. අනතුරුව ප්‍රාචීන, ප්‍රාරම්භ, මධ්‍යම විභාග සමත්ව සිටි නිසා 1960 වර්ෂයේදී විද්‍යෝදය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව ප්‍රථම උපාධියත්, ගෞරව උපාධියත් ලබා ගත්තා. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව විභාගය සමත්වුණා. ඒ වගේම කොරියාවෙන් ආචාර්ය උපාධියක් ලැබී තිබෙන බවත් ,විද්‍යෝදය පිරිවෙනින් දීප්තිමත් ශිෂ්‍යාට පිරිනමන ධර්මශාස්ත්‍ර විභූෂණ ගෞරව නාමය විද්‍යාධර සභාව මගින් 2018 වර්ෂයේ අප්‍රේල් මස 29 වනදින පිරිනැමූ බවත් මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි.

**ධර්මශාස්ත්‍රීය, ආගමික, ශාසනික කාර්යභාරයට සම්බන්ධවුණේ කුමන ආකාරයෙන් ද? අනුනායක හාමුදුරුවනේ,**

එම වකවානුවේදී උපාධිධාරී භික්ෂූන් වහන්සේලාට රජයේ පාසල්වල ගුරුපත්වීම් ලබාදීමේ අවස්ථාව මටත් හිමිවුණා. ඒ අනුව රත්නපුර බළන්ගොඩ පින්නවල උඩගම මහා විද්‍යාලය, හපුතලේ අධ්‍යාපන කලාපයේ වල්හපුතැන්න මහා විද්‍යාලය ආදී පාසල්වල වසර 10 ක දුෂ්කර සේවයෙන් පසුව නැවත කොළඹට වැඩම කළා. ගුරුසේවයේ යෙදෙමින් සිටි අවධියේ තවදුරටත් සේවය කිරීමට කාලය තිබියදීත් 1992 වර්ෂයේදී විශ්‍රාම ගැනීමට සිදුවුණා. එයට හේතුවුණේ ගුරුදේවයන් වහන්සේගේ අපවත්වීමත් සමඟ විහාරස්ථාන ගණනාවක ශාසනික කටයුතු කිරීමට සිදුවීම යි.

එවකට මහානායක ධූරය දැරූ මරදාන කුප්පියාවත්ත ජයසේකරාරාමාධිපති රාජකීය පණ්ඩිත තලලේ ධම්මානන්ද මහානායක හිමියන් ප්‍රමුඛ සුධර්මාකාරක සංඝ සභාවේ අනුමැතියෙන් ශාසනවංශාලංකාර චන්ද්‍රකීර්ති ශ්‍රී ගෞරව නාමය සහිතව රත්නපුරදිස්ත්‍රික්කයේ ප්‍රධාන සංඝ නායක ධූරය පිරිනැමුවා. අනතුරුව රාජකීය පණ්ඩිත බළන්ගොඩ සිරිසද්ධම්මවංශ මහානායක ස්වාමීන් වහන්සේගේ කාල වකවානුවේදී නිකායේ කාරක සංඝ සභාවට පත්කළා. විශාල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පිරිසක් පැවිදි භූමියට පත්කරමින් උන්වහන්සේලාට එම විහාරස්ථානවල ශාසනික කාර්යභාරය පවරා දීමෙන් අනතුරුව මාලඹේ අශෝකාරම විහාරස්ථානය ඉදිකළා. මේ කාලයේදී නිකායේ කටයුතු සඳහා වැඩි සම්බන්ධකමක් පැවැත්වීමට සිදුවීමත් සමඟ අමරපුර සද්ධම්මවංශ මහා නිකායේ වර්තමාන මහානායක අහුන්ගල්ලේ සිරිසීලවිසුද්ධි නායක ස්වාමින්ද්‍රයන් වහන්සේගේ අනුග්‍රහයෙන් නිකායේ මහලේකම් ධූරයට පත්කළා . වසර ගණනාවක් නිකායේ කටයුතු ඇඩි කැපකිරීමකින් සිදුකිරීම නිසා එම කාලපරිච්ජේදය තුළම මහානායක හාමුදුරුවන් වහන්සේ ඇතුළු කාරක සංඝ සභාවේ සමානච්ඡන්දයෙන් නිකායේ අනුනායක ධූරය පිරිනැමුවා.

ඒ වගේම ශාස්ත්‍රීය වශයෙන් තථාගත දේශනා, පුනරුප්පත්ති හා වෙනත් ලිපි, කෝට්ටේ සංස්කෘතික උරුමය, ගෘහස්ත සීලය , කඨිනානිසංස ධර්ම දේශනාව, අටලෝ දහම, මිත්‍රත්වය හා මෛත්‍රියේ ආනිසංස, පොසොන් සුවඳ, බෝධිපාක්ෂික ධර්ම දේශනා, ඉසිපතන පුදබිම හා චෛත්‍ය ඉතිහාසය සහ තෝරාගත් සූත්‍ර අනුසාරයෙන් රචනා කළ ග්‍රන්ථ ආදී වශයෙන් ග්‍රන්ථ රාශියක් රචනා කොට තිබෙනවා. තායිලන්තය, ඉන්දියාව, බුරුමය, සිංගප්පූරුව, මැලේසියාව, සුමාත්‍රා , එංගලන්තය ආදී රටවල ධර්මදූත සේවය සඳහා සහභාගිවී ඇති බවත් සිහිපත් කළ යුතුයි.

ඒ වගේම මාලඹේ සුසිතපුර අශෝකාරාමය, මොරටුමුල්ල සද්ධර්මරාජ මහා විහාරය, මහායාල ශ්‍රී පුෂ්පාරාමය, පැල්පොල ඉසිපතනාරාමය, රාජගිරිය උභයසේකරපුර අභිනවාරාමය හා උභයසේකරපුර ධර්මදූත ආශ්‍රමය යන විහාරස්ථාන මගේ පාලනය යටතේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ජාතික, ආගමික, ශාසනික කටයුතු සිදුකරමින් වැඩසිටිනවා. සිසුන් 250 ක් දහම් අධ්‍යාපනය ලබන සුසීත දහම් පාසල, සිරිවජිරවංශ දහම් පාසල, අරියවංශ දහම් පාසල, ධර්මදූත විද්‍යාකීර්ති දහම් පාසල ආදී දහම් පාසල් ආරම්භ කිරීමටත් කටයුතු කර තිබෙනවා.


**පුංචි හාමුදුරුවන් වහන්සේ නමක් වශයෙන් ශාසනික දායාදය ලබා නිකායේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් වැඩ සිටින ඔබ වහන්සේ නූතනයේ හැදෙන වැඩෙන ස්වාමීන් වහන්සේලාට ලබාදෙන අවවාද අනුශාසනා මොනවගේ ද? නායක හාමුදුරුවනේ.**

දේශපාලන ක්‍රියාවලියට අපේ කිසිදු සම්බන්ධතාවයක් නැති බව සිහිපත් කළ යුතුයි. උපසම්පදාකරන අවස්ථාවේදී උපසම්පදාපේක්ෂක සාමණේර භික්ෂූන් වහන්සේලා සියලු දෙනාම එකම ස්ථානයකට වැඩමවා දින 2 ක පුහුණුවක් ලබාදෙමින් උන්වහන්සේලාට උපසම්පදාව පිළිබඳව අවශ්‍ය සියලු උපදෙස් ලබා දෙනවා. ඒ සඳහා සුදුසුකම් ලැබූ සියලුම ස්වාමීන් වහන්සේලා පරීක්ෂණයකට සහභාගිකරවමින් එයින් සමත්වුණ පිරිස පමණක් උපසම්පදා විනයකර්මය සඳහා වැඩමවනවා. සියලු විනයකර්ම හා වත්පිළිවෙත් පිළිබඳව භික්ෂූන් වහන්සේලාට පහදා දෙනවා. පිරිවෙන් අධ්‍යාපනයේදී ප්‍රාචීන, ප්‍රාරම්භ, විභාග සඳහා යොමුකරමින් සමත් වූ පසුව විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා අවස්ථාව සලසාදී තිබෙනවා. අපේ පුංචි කාලයට වඩා වර්තමාන සමාජයේ හැදෙන වැඩෙන දරුවන් තුළ ඒ තරම්ම ශ්‍රද්ධාව, ගෞරවය අඩු බවක් පේනවා. එනිසා උන්වහන්සේලා හොඳින් හදාගැනීමට හුඟාක් උත්සාහ ගන්නවා.

හේමමාලා රන්දුනු

# ස්ථානෝචිත ප්‍රඥාවෙන් වැඩ ගන්නා හැටි

## වානර ජාතක කතාව



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ
අමරවංශ හිමි**

**වානර ජාතකයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ බුද්ධිය පිහිටි දෙදෙනකු තම අරමුණු වෙනුවෙන් උපක්‍රම සංවිධානය කිරීමේ දී වඩාත් සාර්ථක උපක්‍රමය යොදා ගන්නා පුද්ගලයා ජය ලබා ගන්නා පුවතකි.**

ස්ථානෝචිත ප්‍රඥාව සහිත පුද්ගලයින් දෙ දෙනකු හමු වූ විට ද වඩාත් වැදගත් වන්නේ සාර්ථක ම උපක්‍රමයයි. එබැවින් කවර කටයුත්තක් සංවිධානය කළත් වඩාත් ම උචිත උපක්‍රමය යෙදීම අරමුණු ඉටුකර ගැනීමට ඉවහල්වන බව තවදුරටත් පෙන්වා දෙති.

මෙම ජාතක කථාව දම් සභාවට රැස් වූ භික්ෂු සංඝයාගේ ආරාධනාව අනුව දෙව්දත් තෙරුන් වහන්සේ අරබයා දේශනා කළ එකකි. සුජීවත්වන ලෝකයාට මෙලොව සහ පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට දැනුම දෙන ජාතක කතාවකි. සංඝයාගේ ආරාධනාවෙන් ධර්මාසනයේ වැඩ හුන් බුදුරජාණන් වහන්සේ පෙර අත්භවයක දී දෙව්දත් තෙරුන් යෙදූ කූට උපක්‍රමයකට හසු නොවී ගැළවුණු බවත්, එය සාර්ථකව ව්‍යාර්ථ කළ බවත්, වඩාත් උචිතම උපක්‍රමයක් යොදා ගත් බවත්, දක්වමින් වානර ජාතකය මෙසේ දේශනා කළහ.

පින්වත් මහණෙනි, යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනකු දැහැමින් රාජ්‍ය පාලනය කළා. එ සමයේ මම වානර කුලයේ ඉපදී සිටියා. මගේ නිවහන වුණේ එරට හිමවත් පෙදෙසේ විශාල ගහක්. ගසෙහි දළු සහ කොළ මගේ ආහාරය වුණා. ගෙඩි හටගන්නා සමයට ඉතා සතුටින් ඒවායෙන් කුස පුරවා ගත්තා. ජලය ලබා ගැනීමට එතරම් අපහසු වුණේ නැහැ. ගහ සමීපයෙන් ම විශාල ගංගාවක් තිබුණා.

මට තවත් එක් යාලුවෙක් ගඟේ හිටියා. ඒ විශාල ශරීරයක් හිමි, ශක්ති සම්පන්න කිඹුලෙක්. නිතර ඌත් සමග මම කථා බස් කළා. කාන්සිය, පාලුව නැති කර ගැනීමට අපි දෙන්නා දෙන්නට උපකාර වුණා. එයාට කිඹුල් බිරිඳක් හිටියා. ඇයත් මා සමග සමීප වුණා.

දින සති ගෙවමින් වසර ගණනක් මෙසේ ගෙවී ගියා. මිතුරුකම නම් තව තවත් වැඩි වුණා. දිනක් මිතුරුකම් වැඩි වූ නිසාම කිඹුල් යාළුවා මට මෙහෙම යෝජනාවක් කළා.

මිතුරේ, දැන් ගඟෙන් මෙගොඩ බොහෝ කලක් නුඹ ජීවත් වුණා. එකම ගහේ දළු සහ කොළ අනුභව කළා. එකම පලතුරු හැමදාම අනුභව කළා. ඉතින් මට නුඹ ගැන බොහෝම දුකයි. අප දෙදෙනා හොඳම මිතුරන් නිසා මට පුළුවන් ඔබට මේ දුකින් නිදහස් වෙන්න උපකාරයක් කරන්න යනුවෙන් පවසා සිටියා.

වඳුරාත් හොඳින් වැඩුණු, මාංශවලින් පිරී ගිය, බබළන දේහයකින් යුක්ත අයෙක් වුණා. ගඟෙන් එගොඩට පැනීමට නොහැකි තරම් ගංගාව පුළුල් වී තිබුණා. වඳුරාගේ දේහය පිරිපුන් ය. අධික බරකින් යුක්ත ය. ඒ නිසා එතරම් දුරක් පැනීමට නො හැකි තත්වයෙන් ද පසුවුණා. කිඹුලා ඒ සියල්ල හොඳින් අවබෝධ කරගෙන මිතුරාට උපකාර කරන අදහසින් එසේ පවසා සිටියා.

කිඹුලාගේ කථාව අසා සිටි වඳුරා, උපකාර කරන්නේ නම් එය ලබා ගැනීම ඔහුට ද ගරු කිරීමක් වන්නේ යැයි සලකා කිඹුලා අමතා

"අනේ පින්වත් යාළුවේ, මටත් දැන් ගඟේ මෙගොඩ ජීවිතය හොඳටම එපා වෙලා ඉන්නේ. ඉතින් ඔබ කොහොමද මේ ජීවිතය වෙනස් කරන්න හදන්නේ යැයි ප්‍රශ්න අසා සිටියා. එවිට කිඹුලා "පින්වත් යාළුවේ, ඔබ කරදර වෙන්න එපා. මම මගේ පිට මත නුඹ හිඳුවාගෙන ගඟෙන් එතෙර කරන්නෙමි., එහි ගොස් අලුත් පලතුරු ආදිය අනුභව කරමින් අලුත් ජීවිතයක් ගත කරන්න., එහෙත් පෙර සේ ම අපගේ මිතුරුකම් එලෙසම පවත්වා ගන්න යැයි යෝජනාවකුත් කළා. වඳුරාත් යාළුවාගේ යෝජනාව අනුමත කරමින් ගමනට සූදානම් වුණා. කිඹුලාටත් බොහෝම සතුටු හිතුණා. මගේ කූට උපක්‍රමයට මේ මෝඩ වඳුරා අහුවුණා. ශරීරය කොතරම් වැඩී තිබුණත්, මූට මොළයක් නැ. වඳුරා රවටා බිරිඳගේ ආශාව ඉටු කරන්න පුළුවන් යැයි සිතමින් සිය දහස් වතාවක් සතුටට පත් වුණා. බිරිඳ සිය සැමියා අමතා කියූ වදන් ඔහුගේ හදවතේ ගිගුම් දෙන්නට පටන් ගත්තා. ඇය දරුගැබක් දරන බැවින් දිනක් කිඹුලා අමතා මෙසේ කියා තිබුණා.

"පින්වත් ස්වාමියෙනි, ඔබගේ දරුවන් මා කුස පිළිසිඳගෙන සිටියි. එබැවින් මට දෙළක් උපන්නා. ඔබ එය ලබා නො දෙන්නේ නම් නො කා නො බීම මම මියයන්නෙමි. එවිට ඔබගේ දරුවන් ද මිය යන්නේ ය. එබැවින් මගේ දෙළ සංසිඳවා දෙන්න යැයි ඉල්ලා සිටියා.

එවිට, කිඹුලා "පින්වත් සොඳුරිය, ඔබගේ ආශාව පවසන්න., කළ හැකි කටයුත්තක් නම් වහා සපුරා දෙන්නෙමියි පවසා සිටියා. එවිට කියන්නේ


"පින්වත් ස්වාමියෙනි, මට ඔබගේ මිතුරාගේ හදවත් මාංශය කෑමට දෙළක් උපන්නා., එය වහා සපුරා දෙන්න යැයි පවසා සිටියා. තම යාළුවාට එරෙහිව එය කරන්නේ කෙසේ දැයි කිඹුලා නිතර කල්පනා කරන්න පටන් ගත්තා. එ විට ඔහුට මේ උපක්‍රමය සිහි වුණා.

එය දැන් සම්පූර්ණ වීමට ඉතා ආසන්න යැයි සිතමින් බොහෝ සතුටට පත් වුණා. සිය බිරිඳටත් ඒ බව පවසමින් තව තවත් සතුටු වුණා. යොදා ගත් අයුරින් ම වේලාව උදා වුණා. තම මිතුරාගේ උපකාරය ලබා ගැනීමේ අරමුණින් වඳුරා කිඹුලාගේ පිටමත නැඟී හිඳ ගත්තා. කිඹුලාත් විශාල වූ, ගැඹුරු වූ ගංගාව මැදට ගොස් ක්‍රමයෙන් දිය යටට යන්නට පටන් ගත්තා. එවිට වඳුරා බියට පත් වී කිඹුලා අමතා "යාළුවේ මේ මොකද වෙන්නේ? ඔබට කරදරයක් නිසා ද ඔබ දිය යටට මෙසේ යන්නේ යැයි විමසා සිටියා.

එවිට කිඹුලා සිනා සෙමින් "යාළුවේ මම නුඹ ගඟ මැදට ගෙනාවේ නුඹට ආදරයෙන් ද? සෙනහසින් ද? යැයි සිනහ සෙමින් නැවතත් මෙහෙම කිව්වා "මම තොප මෙහි ගෙන ආවේ මගේ බිරිඳගේ දෙළක් සංසිඳවීමටයි. ඇය දැන් ගැබ් ගෙන සිටින්නේ., ඉතින් තොපගේ හෘදය මාංශය නැතිව ඇය මිය යන්නට ළංවී සිටින්නේ., එබැවින් තොපගේ හෘදයමාංශය ගැනීමට තොප මෙහි ගෙන ආවෙමි යැයි බොහෝ ජයග්‍රාහී ලීලාවෙන් පවසා සිටියා. වහා සියලු තතු අවබෝධ කරගත් වඳුරා ආදරයෙන් කිඹුලා අමතමින් "යාළුවේ ඔය කරුණ මට කලින්ම කියන්න තිබුණනේ., මටත් බොහෝ පින්සිදුවන වැඩක්නේ මේ යෙදී තිබෙන්නේ., ඉතින් එම කාර්ය මම හොඳින්ම කර දෙන්නම්., ඔබ බිය වෙන්න එපා. ඔබට පේනවා නේද මම හිටපු ගහ සමීපයෙහි තිබෙන දිඹුල් ගස, එහි උඩින්ම තියන රතුපාට ගෙඩියක් පේනවා නේද? ඉතින් මම හදවත එහි එල්ලා පැමිණියා., ගඟ මැද දී අනතුරක් වුවහොත් පසුව ගැනීමට., ඉතින් මා එහි නැවතත් ගෙන යන්න., ඔබගේ අවශ්‍යතාව මම ගිය වහාම ගසෙන් අරගෙන දෙන්නම්., එය බිරිඳට දී දෙළ සංසිඳවා හොඳ දරුවන් ලබා ගන්න යැයි තම නුවණ පාවිච්චි කරමින් පවසා සිටියා.

කිඹුලාත් දිඹුල් ගස දිහා බලා රතුපාටින් පෙනෙන දිඹුල් ගෙඩියක් දැක යෝජනාවට කැමති වී නැවතත් වඳුරා සිටි තැනට ම ගිහින් දැම්මා. වඳුරා වහා උගේ පිට මතින් ගොඩට පැන "තොප මා රැවටුවා., මම තොප රැවටුවෙමි., වඳුරාගේ හෘදය මාංශය දිඹුල් ගසක තිබේද? තා රවටාලා මාගේ ප්‍රාණය ගලවා ගත්තෙමි., ගඟෙන් එතර එළ රසවලින් මට කම් නැත" යි කියමින් වඳුරා ඉතා සතුටින් තම වාසභවනට ම නැවතත් පිටත් වී ගියා.

ඉතින් පින්වත් මහණෙනි, එකල මගේ ප්‍රාණය නැසීමට උපක්‍රම යෙදූ ඒ කිඹුලා මෙකල මට විවධ කූට උපක්‍රම යොදා මාගේ දිවි තොර කිරීමට සැරසෙන දෙව්දත් තෙරුන් ය. වඳුරා ව උපන්නේ ලොව්තුරා බුදු වූ මම්ම වේ දැයි පවසමින් වානර ජාතක කථාව අවසන් කළා. භික්ෂූන් වහන්සේලා බොහෝ සාධුකාර දී බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළා.



සිතුවම - අන්තර්ජාලයෙනි

2021 ජූනි 18 වනදා සිකුරාදා බුදුසරණ 07

# ලෝ සත වෙත මෙත් වඩමු

**"මහණෙනි, මේ සසුනෙහි යම් භික්ෂුවක් අසුරුසනක් ගසන කෙටි කාලයක් නමුදු සියලු සතුන් කෙරෙහි මෙත් සිත වඩනවා නම් මහණෙනි, ඒ භික්ෂුව මේ සසුනෙහි ධ්‍යාන ඇත්තෙක් බවට පත් වේ.**

**ලෝ සත වෙත මෙත් වඩන්නේ කෙසේද යන පැනයට පිළිතුරු මෛත්‍රී භාවනාවෙන් අපට කියා දෙයි. එහි පළමුවෙන් හුරු කරන්නේ තමාට මෛත්‍රිය වඩන ආකාරයයි. තමාට මෛත්‍රිය, ආදරය, කරුණාව නො දක්වන අයකුට අන්‍යයන්ට මෛත්‍රිය වැඩිය නො හැකි ය. ඒ නිසා, "මම නිදුක් වෙම්වා, මම නීරෝගි වෙම්වා, මම සුවපත් වෙම්වා, මම දුකින් මිදෙම්වා, මම නිවන් ලබම්වා."**

යැයි පළමු ව තමාට මෛත්‍රී වැඩීම කළ යුතු ආකාරය දක්වා ඇත. එලෙස තමාට ආදරය, කරුණාව දක්වන්නා අනතුරුව තමා අවට සිටින සමීපතමයන් කෙරෙහි මෛත්‍රිය වඩයි. කරුණාවෙන් සලකයි. එය මෛත්‍රී භාවනාවේ දී දක්වා ඇත්තේ මෙසේ ය.

"මා මෙන් ම මාගේ මව්පිය ගුරුවරු හිතවත්තයෝ ද, මැදහත් සත්ත්වයෝ ද, වෛර නැත්තෝ වෙත්වා. තරහ නැත්තෝ වෙත්වා. නපුරු අදහස් නැත්තෝ වෙත්වා. දුක් පීඩා නැත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා. නිරෝගී වෙත්වා. සුවපත් වෙත්වා. දුකින් මිදෙත්වා. නිවන් ලබත්වා.

යනුවෙන් තම සමීප හිත මිතුරන්, ඥාතීන් කෙරෙහි මෛත්‍රිය වඩති. ඉන් පසු ලෝ තලයේ ජීවත් වන පෙනෙන නොපෙනෙන සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වැඩීමට යොමු වේ. එය විස්තර වන්නේ,

"මේ ගමෙහි ද, මේ නගරයෙහි ද, මේ ලක්දිව ද, මේ දඹදිව් තලයෙහි ද, මේ සක්වළෙහි ද වාසය කරන්නා වූ සියලු සත්ත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. තරහ නැත්තෝ වෙත්වා. නපුරු අදහස් නැත්තෝ වෙත්වා. දුක් පීඩා නැත්තෝ වෙත්වා. දුකින් මිදෙත්වා. නිවන් ලබත්වා. කිසිවෙක් කිසිවකුට වෛර නො කරත්වා. කිසිවෙක් කිසිවකුට නින්ද නො කරත්වා. කිසිවෙක් කිසිවකුට අවමන් නොකරත්වා. සියල්ලන් ම සියල්ලන්ගේ ම සැප කැමැත්තෝ වෙත්වා. තුනුරුවන්ගේ අනන්ත සූවිසි මහ ගුණ බලයෙන් ලෝවැසි සියල්ලන්ට ම සැනසිල්ල වේවා" යනුවෙනි. මෙලෙස මෛත්‍රිය වැඞීමෙන් ලෝ සතුන්ගේ ද ආදරය, කරුණාව, දයාව හා මෛත්‍රිය නිරන්තරයෙන් ලබන්නකු බවට තමා ද පත්වෙයි. මෛත්‍රිය උතුරන සිතින් යුතු පුද්ගලයකුට ලැබෙන්නේ මෙවැනි ආශිර්වාදයකි.

ඉහත මෛත්‍රී භාවනාව පාලි පාඨ සහිත ව මෙලෙස ද පැහැදිලි කළ හැකි ය.

***" අත්තූපමාය සබ්බේසං***
***සත්තානං සුඛ කාමතං***
***පස්සිත්වා කමතො මෙත්තං***
***සබ්බ සත්තෙසු භාවයෙ"***

සියලු සත්ත්වයන් සැප කැමැති බව තමා උපමා කොට බලා පිළිවෙළින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය කටයුතුයි.

***"සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො***
***අහං නිච්චං මමං විය***
***හිතා ච මෙ සුඛී හොන්තු***
***මජ්ඣත්තාවථ වෙරිනො"***

මම නිරතුරුව සැපවත් වෙම්වා. මා මෙන් මට හිත වූ මවුපියාදීහු ද' මැදහත් සත්ත්වයෝ ද, වෛරී සත්ත්වයෝ ද සුවපත් වෙත්වා.

***"ඉම්මහි ගාමක්ඛෙත්තම්හි***
***සත්තා හොන්තු සුඛී සදා***
***තතෝ පරඤ්ච රජ්ජෙසු***
***චක්කවාලෙසු ජන්තුනො"***

මෙම ග්‍රාම ක්ෂේත්‍රයෙහි සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා. එයින් ඔබ්බෙහි අන්‍ය රාජ්‍යවල ද, සක්වළෙහි ද සත්ත්වයෝ සුවපත් වෙත්වා.

***"සමන්තා චක්කවාළෙසු***
***සත්තානන්තෙසු පාණිනො***
***සුඛිනො පුග්ගලා භූතා***
***අත්තභා ච ගතා සියුං"***

මෙයට හාත්පස පිහිටි සක්වළ යන්හි සත්වයෝ ද, ප්‍රාණීයෝ ද, පුද්ගලයෝ ද, භූතයෝ ද, ආත්ම භාවයට ගියාහු ද, සුවපත් වෙත්වා.

***"තථා ඉත්ථී පුමා චෙව***
***අරියා අනරියාපි ච***
***දෙවා නරා අපායට්ඨා***
***තථා දස දිසාසුවාති"***

ස්ත්‍රීහු ද, පුරුෂයෝ ද, ආර්යයෝ ද, පෘථග්ජනයෝ ද, දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, සතර අපායෙහි සිටි සත්ත්වයෝ ද, සුවපත් වෙත්වා.

අනතුරුව බුදුරජාණන් වහන්සේ ක්‍රෝධය වෙනුවට සියලුම සත්ත්වයන්ට මෛත්‍රිය වඩන්නකුට ලැබෙන ආශිර්වාදයන් රැසක් මෙත්තානිසංස සූත්‍ර දේශනාවේ දී දක්වා ඇත.

"දිනක් බුදුරජාණන් වහන්සේ කොසොල් රට සැරි සරන අතරේ දී භික්ෂූන් වහන්සේ අරමුණු කොට අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කළහ. මෙම සූත්‍රය ඇසූ භික්ෂූන් සැට නමක් රහත් වූහ. සැට නමක් ලේ වමාරන්නට වූහ. තවත් සැට නමක් සිවුරු හැර ගිහි වන්නට විය. මෙසේ දම් දෙසා නැවත දෙව්රම් වෙහෙරට වැඩම කළ පසු වෙහෙරේ වෙනද මෙන් භික්ෂූන් නැති බව දුටු බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන්ගෙන් කරුණු විමසී ය. එවිට අනඳ තෙරණුවෝ මෙසේ පැහැදිලි කළහ.

භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කිරීම නිසා භික්ෂූන් සංවේගයට පත් ව අපට මේ ශාසනයේ පිළිවෙත් පිරීමට නො හැකි බවත්, නො මනා පැවතුම් ඇති ව සැදැහැතියන්ගේ දන් පිළිගැනීම නුසුදුසු බවත් පවසා සිවුරු හැර ගියහ. මේ පුවත ඇසූ බුදුහු ධර්ම සංවේගයට පත් වූහ. ඉක්බිති ව අනඳ තෙරුන් ලවා භික්ෂූන් රැස් කරවා මෙසේ දේශනා කළහ. ගඟකට බසින්නට බොහෝ තොටුපළවල් ඇත්තාක් මෙන්, මෙම සසුනෙහි සැනසෙන්නට බොහෝ දේ තිබෙන බව යි.

"මහණෙනි, මේ සසුනෙහි යම් භික්ෂුවක් අසුරුසනක් ගසන කෙටි කාලයක් නමුදු සියලු සතුන් කෙරෙහි මෙත් සිත වඩනවා නම් මහණෙනි, ඒ භික්ෂුව මේ සසුනෙහි ධ්‍යාන ඇත්තෙක් බවට පත් වේ. දායකයින් දෙන දන් වැළඳීමට සුදුස්සෙකු බවට පත් වේ යැයි දේශනා කළහ."

තවදුරටත් කරුණු ඉදිරිපත් කළ බුදුරජාණන් වහන්සේ ක්‍රෝධයෙන් හා වෛරයෙන් තොර ව මෛත්‍රීයෙන් සිත පුරවා ගත්තකුට ලැබෙන ආනිශංස එකොළහක් මෙසේ දේශනා කළහ. එනම්,

"සුඛං සුපති. සුඛං පටිබුජ්ඣති. න පාපකං සිපිනං පස්සති. මනුස්සානං පියො හොති. අමනුස්සානං පියො හොති. දෙවතා රක්ඛන්ති. නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා කමති. තුවටං චිත්තං සමාධියති. මුඛ වණ්ණො විප්පසීදති. අසම්මුළ්හො කාලං කරොති. උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්ම ලොකූපගො හොති."



ගැටහැත්ත බෝපැත්ත
ශ්‍රී සෝමානන්ද
ඉංග්‍රීසි මාධ්‍ය මූලික පිරිවෙන්
විහාරාධිපති
ශාස්ත්‍රවේදී
**රාස්සගල චන්දකිත්ති හිමි**

සැප සේ නිදයි, නපුරු සිහින නො දකියි, අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වේ, සිත එකග වේ, නො මුළාව කළුරිය කරයි, ගිනි, විෂ, ආයුධ ආදියෙන් වන විපතක් නැත, මෛත්‍රිය සමවතින් මතු රහත් වන්නට නොහැකි වී නම් මරණින් මතු බඹලොව උපදියි. සැප සේ අවදි වේ, මිනිසුන්ට ප්‍රිය වේ, දෙවියෝ රකිති, මුහුණ පැහැපත් වේ.

මේ සූත්‍රය අවසන් වන විට එතෙක් භික්ෂූන්ගේ සිතෙහි පැවති කනගාටුව, කළකිරීම, සන්තාපය නැති වී ගොස් ප්‍රීතිය ඇති විය. භික්ෂූහු තුටු සිතින් යුතු ව වීර්යයෙන් මඟඵල ලබන්නට කටයුතු කළහ. ඊට අමතර ව ඛන්ධ පරිත්ත දේශනාවේ ද මෛත්‍රී පූර්වක ව ක්‍රියා කිරීම පුද්ගලයාට බාහිර ව වන විෂකුරු සතුන් වැන්නන්ගේ උපද්‍රවවලින් මිදීමට හේතු වන ආකාරය පහත අයුරින් දේශනා කර ඇත. එනිසා මිනිසුන් පමණක් විෂයෙහි නො ව, සතුන් කෙරෙහි ද මෛත්‍රී චිත්තයෙන් ක්‍රියා කිරීම සැපත පිණිස හේතු වන බව මෙමඟින් පැහැදිලි වේ.

***"සබ්බේ සත්තා සබ්බේ පාණා***
***සබ්බේ භූතා ච කෙවලා***
***සබ්බේ භද්‍රානි පස්සන්තු***
***මා කඤ්චි පාපමාගමා"***

හැම සත්ත්වයෝ ද, හැම ප්‍රාණීහු ද, සියලු භූතයෝ ද යන හැම දෙනා ම යහපතක් ම දකිත්වා. මොවුන් කෙරෙහි කිසිත් කරදරයක්, දුකක් නො පැමිණෙත්වා. මෛත්‍රී සිත් පෙරටුව තිරිසන් සතුන් වෙත ද කරුණාවෙන් බලා කටයුතු කිරීම පුද්ගල සැනසීම පිණිස හේතුවන ආකාරය මෙම සූත්‍රයෙන් ද පැහැදිලි වේ. සතුන්ට පවා ආදරයෙන්, කරුණාවෙන් හා මෛත්‍රියෙන් කටයුතු කිරීමෙන් තිරිසන් සතුන් වුවත් අපට අනතුරක්, පීඩාවක් හෝ කරද-රයක් නො කරන බව මෙම කරුණුවලින් පැහැදිලි වේ. එබැවින් ක්‍රෝධයෙන් පහ වූ සිත් ඇති ව, මෛත්‍රියෙන් අනූන වූ සිත් ඇති ව ජීවත් වීම සැපය, සතුට පිණිස වන බව අවබෝධ කර ගත හැකි ය. කරණීය මෙත්ත සූත්‍රයේ දී ද මෛත්‍රී චිත්තය වැඩීමේ වැදගත්කම, හරවත් බව මෙසේ තේරුම් කරයි.

***"මෙත්තං ච සබ්බලොකස්මිං***
***මානසං භාවයේ අපරිමාණං***
***උද්ධං අධො ච තිරියං ච***
***අසම්බාධං අවෙරං අසපත්තං"***

***"තිට්ඨං චරං නිසින්නො වා***
***සයානො වා යාවතස්ස විගතමිද්ධො***
***එතං සතිං අධිට්ඨෙය්‍ය***
***බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු"***

සිටගෙන හෝ ඇවිදින හෝ හිඳින හෝ නිදන හෝ යන මේ සෑම අවස්ථාව ක ම මෛත්‍රී සහගත සිහියෙන් සිටිනු කැමැත්තේ ද, ඒ තාක් කල් පහ වූ මිද්ධය හා අලස බව ඇති ව අධිෂ්ඨාන කරන්නේ ය. මෙම මෛත්‍රී විවරණය මේ බුද්ධ ශාසනයේ ශ්‍රේෂ්ඨ ම විවරණය වේ. මෙයින් පැහැදිලි වන්නේ සිටින, ඇවිදින, සිටගෙන හා නිදන යන ඉරියව් සතරේ දී ම මෛත්‍රී පූර්වාංගම කුසල සිතින් ක්‍රියා කිරීම යහපත පිණිස, ජීවිතයේ දියුණුව පිණිස හේතුවන බව ය.

මේ කරුණු සියල්ල නුවණින් තේරුම් ගනිමින් සියලු සත්ත්වයන් කෙරෙහි ඇති කරගත් කාරුණික සිතක් හා හෘදයාංගම දයාවක් සහිත ව මෛත්‍රිය සහගත චේතනාවන් ගෙන් ජීවිතය ගවසා ගෙන, මෙලොවත් පරලොවත් සැපය පිණිස ක්‍රෝධය, වෛරය, ද්වේෂය, තරහව නම් වූ අකුසල චිත්ත චෛතසිකයන් දුරින් ම දුරු කිරීමට මෙලෙස ධර්මයෙන් ලැබෙන මඟ පෙන්වීම නිවැරදිව තේරුම් ගත යුතු ය. ක්‍රෝධයේ ආදීනව මෙලොව පරලොව දුගතිය පිණිස බලපාන අයුරු සිහියෙන් දැකිය යුතු ය. සුවපත් මනසක් සහිත ජීවිතයක් ගත කළ හැක්කේ එවිට ය.

***සිතකය වදනින් මෙත් ගුණ — මතුවී***
***සාමය සමගිය ලෝ තුළ — පැතිරී***
***සැමදෙන එක මවකගෙ දරු — කැළ සේ***
***සොම්නස් වෙත්වා සැන — සෙත්වා***

**සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා. නීරෝගි වෙත්වා. සුවපත් වෙත්වා.**



## බුදු මහිමය

***බුදු හාමුදුරුවෝ පිළිබඳ මංගල කරුණු තුනක් වුණ වෙසඟ — දිනේ***
***සුදු සුදු මල් පිපිලා ඇස සනසයි සුවඳින් නැහැයට සුවඳ — ගෙනේ***
***පුදුමාකාරයි ගුණයට දහමට සෝබා දහමත් බඳින — සෙනේ***
***ඉඳුරා ඒ දැන දැක මිනිසුන් ලෙස සැනසෙමු ගුණ දම් සිසිල — ගෙනේ***

***ලොව ය කියන්නේ හරි විදියෙන් නම් අනියත දුකනත කියන — තුනයි***
***තව මොනවද විමසීමට ඇත්තේ තුන් ලෝ ගුරු හිමි දෙසුව — බණයි***
***අවබෝධය පිළිබඳ විමසීමෙ දී මෙකී ලකුණු තුන ඉහළ — තැනයි***
***නිවන කියන්නේ මේ තෙලකුණු ගැන කිසි පරිහරණක් නොමැති — වුණයි***

***පතා ම බුදුබව පුරා පෙරුම් දම් සාරාසකිකප් ලනෙන් — වට***
***ආ මරු ගිරි මේකල ඇතු මාර සෙනඟ දැමු දසුන් — කොට***
***හිතා හිතව ලෝකයේ සුදුසු අය පත් කරවාලු නිවන් — ගෙට***
***ඉතාමත් ම මදි සිතේ ය තුන් ලෝ ගුරු පදවිය සම්බුදුන් — හට***

**උඩුගම විජිත හිමි**
**රාජගිරිලෙන් විහාරය, ඉහළ හෝමදෙල**

බුදු සරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

**පොසොන් පුර අටවක 2021.06.18**

## රැකවරණය

ජීවිතාරක්ෂාව මෙකල බෙහෙවින් අවධානයට ලක්ව ඇති මාතෘකාවකි. ලොව පුරා පැතිර පවත්නා වසංගත රෝග බිය ඊට ප්‍රධානතම හේතුව ය. රෝග පීඩාදී අනතුරු හැරුණු කොට තවත් අනේකවිධ අනතුරුවලින් රැකෙන්නට අපි විවිධ උපක්‍රම භාවිත කරමු. එහෙත් බොහෝ දෙනකුගේ අවධානය යොමු නොවූ ජීවිතාරක්ෂක ක්‍රමවේදයක් ඇත. එහි සුවිශේෂත්වයක් ඇත. එය මවගෙන් හෝ පියාගෙන් හෝ ලබාගත නොහැකි රැකවරණයකි. සහෝදර සහෝදරියන්ගෙන්, ඥාති මිත්‍රාදීන්ගෙන් හෝ බාහිර සමාජයෙන් ලබාගත නොහැකි රැකවරණයකි. ඒ ධර්මයේ රැකවරණයයි. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ධර්මය විසින්ම ආරක්ෂා කරන බවයි දහමෙහි සඳහන් වන්නේ.

ධර්මය තුළ අවධාරණය කරන ප්‍රධානතම අංගය සිල්වත් බවයි. සීලය නම් අප තුළ ගොඩනඟා ගත යුතු යහපත් චරිත ශක්තියයි. එවැනි පුද්ගලයාගෙන් තමන්ට ආරක්ෂාව සැලසෙනවා සේ ම සමාජය ද සුරක්ෂිත වන්නේ ය. ඒ, එවැන්නකු අතින් අන්‍යයන්ගේ ජීවිත හා දේපළවලට හානියක් නොවන නිසා ය. බොරුවෙන් සමාජය රවටන්නේ නැති නිසා ය. කාමය වරදවා හැසිරීම, සුරා පානය සිදු නොවන නිසා ය. බුදුරජාණන් වහන්සේ ගිහියාට හඳුන්වා දුන් නිත්‍ය ශීලය තුළ වන සුරක්ෂිත බව මතය සමාජයක දියුණුව, රැකවරණය ගොඩනැගෙනුයේ.

බෞද්ධයන් ලෙස අපි දිනකට අවම වශයෙන් දෙවතාවක් හෝ පන්සිල් සමාදන් වෙමු. කට පාඩමෙන් පන්සිල් පද කියවූ පමණින් ඒ රැකවරණය ලද නොහැකි ය. එය ජීවිතයට ප්‍රායෝගික විය යුතු ය.ඒ පිරිස් අතරට වැටෙනුයේ කීයෙන් කී දෙනාද යන්න පිළිබඳ ඇත්තේ ප්‍රශ්නාර්ථයකි. මන්ද පංචශීලය තුළ සුරැකෙන සමාජයක් අප ඉදිරියේ නොවන බැවිනි.

මිනිස්කම ඉක්මවා ගිය තිරශ්චීනකම් නිසා මිනිසා විසින් ම තවත් මිනිසකුගේ ප්‍රාණය උදුරාගනු ලැබීම, සාමාන්‍ය වී ඇත. කිසිදු හිරිකිතයකින් තොරව අනුන්ගේ දේපළ සොරා කෑම, උදුරා ගැනීම අරුමයක් නොවන තැනට පත්ව ඇත. ආත්මාර්ථකාමීත්වයන් සපුරා ගනු පිණිස මුසාවාදය පෙරට පැමිණ ඇත. කාමය වරදවා හැසිරීම, සුරාව තුළ මොන තරම් ආධ්‍යාත්මික පරිහානියකට ලක්ව සිටිනවා ද? ඉදින් තමන් විසින් ම තමන්ගේ ගෙල සිර කරගනිමින් අනුන්ගේ ද ගෙල සිර කරනු ලබන තත්ත්වයකට පැමිණීම තුළ අපට කවර නම් රැකවරණයක් සැලසේ ද?

සොබාදහමෙන් ලද මේ සා භයානක දඬුවම ඒ අධර්මචාරී බව නිසාම නොවේ ද? කොරෝනා වයිරසය අපට මෙතෙක් වැරදුණ තැන් පිළිබඳව ප්‍රායෝගික ව ම පෙන්වා දී තිබේ. ඒ දැක දැකත් මිනිසාට තවමත් අනුන් ගැන සිතන්නට ඉස්පාසුවක් නැති තරම් ය. සරලම උදාහරණයක් විමසමු. රෝග ව්‍යාප්තිය පාලනයට නිර්දේශ කර ඇති මුඛ ආවරණය නිසි ලෙස පැළඳගෙන පාර තොටේ යන්නට තරම්වත් සීලාචාරකමක් නැති මිනිසුන් මොන තරම් සිටිනවාද? ධනයට, නිලයට, බලයට, කීර්තියට, රූපයට යට නොවුණු රෝගය මහා ගං වතුරකින් සියල්ල යටකර දමන්නා සේ භේද නොතකා මිනිසුන් බිලිගනිමින් සිටී. අසල්වැසි ඉන්දියාවේ කනගාටු දායක ස්වභාවය ම ඊට නිදසුන් ය. ජීවිතයේ අස්ථිර බව දැක දැකත් තවමත් ආත්මාර්ථකාමී මිනිසුන් මොන තරම් දීන කාර්යයන්හි නිරත වනවාද? බලවත් වූ ලෝභ, ද්වේශ, මෝහා දී අකුසල සිතිවිලිවලින් පව් රැස් කර ගන්නවා ද?, එහි අවසානය නම් ඛේදජනක ම ය. අප ධර්මානුකූල නොවන තාක් ඒ බිය ජනක අත් දැකීමෙන් බේරී සිටිය නොහැකි ය. ඒ ගැන සිතන්නට, සිතිවිලි ක්‍රියාවට නඟන්නට මේ හොඳම කාලයයි. ධර්මය හැර අන් රැකවරණයක් නැත.එය ළඟා කරගත හැක්කේ ද තමන් ට ම ය. ඇවැසි ඒ ගැන අවදිමත් වීම ය.

## මිහින්තලා පුදබිමේ උන්නතියට උරදෙන

# ධම්මරතන හාමුදුරුවෝ



**ඓතිහාසික මිහින්තලේ රාජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නාහිමිපාණන් වහන්සේගේ 50 වැනි ජන්ම දිනය ජූනි 14 වැනිදාට යෙදී තිබුණි. මේ සටහන උන්වහන්සේට ගෞරව කරනු සඳහා ය.**

මිහින්තලා පුණ්‍යභූමියේ මෑත කාලීන ප්‍රබෝධය ගැන සලකා බලන විට ඒ සඳහා එහි වත්මන් විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන ස්වාමින් වහන්සේගෙන් සිදුවූ සුවිශාල ශාසනික සේවාව අමතක කළ නොහැකි ය.

උන්වහන්සේ රජරට ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ආගමික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික සේවාවන් රැසකට නායකත්වය ලබා දෙති.

1971 ජූනි 14 වැනිදා අනුරාධපුරයේ රැඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වළවාහැංගුණවැවේ දී උපත ලැබූ උන්වහන්සේ පැවිදිදිවියට පිවිසුණේ 1987 දී ය. ඉන්පසු 1991 දී මිහින්තලා රාජමහා විහාරස්ථානයේ විහාරාධිකාරී ධූරයට පත්විය. ඉන්පසු එකල විහාරාධිපති ධූරය දැරූ, තමන් වහන්සේගේ ගුරු හාමුදුරුවන් වහන්සේ වන වළවාහැංගුණවැවේ ශ්‍රී රතනජෝති හිමිපාණන්ගේ අනුශාසනා පරිදි මිහින්තලා රාජමහා විහාරස්ථානයේ සිදු කෙරෙන ආගමික, ශාසනික කටයුතු සඳහා ඇප කැපවී කටයුතු කළහ.

2012 වසරේදී උන්වහන්සේ මිහින්තලේ රාජමහා විහාරස්ථානයේ විහාරාධිපති හා භාරකාර ධූරයට පත්වූහ.

2018 දී අනුබුදු මිහිඳු මාහිමි පරිනිර්වාණ සැමරුම් රාජ්‍ය පුණ්‍ය මහෝත්සවය මෙරට ප්‍රථම වරට මිහින්තලයේ දී ආරම්භ කරන්නට උන්වහන්සේ පෙරමුණ ගත්හ. ඊටපසු 2019 දී ද එම පුණ්‍ය මහෝත්සවය පැවැත්වූ අතර එම වසරේදී ම මිහින්තලා පුදබිම හා පොසොන් දිනය ජාතික උරුමයක් බවට පත්කිරීම සිදු කෙරිණි. මිහින්තලා පොසොන් පෙරහර උත්සවශ්‍රීයෙන් පැවැත්වීම මේ වසරේදී ම සිදුවූයේ ධම්මරතන හිමියන්ගේ අනුශාසනා පරිදි ය.

2020 දී පැවැත්වුණු අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ පිරිනිවන් පා 2280 වන සංවත්සරය නිමිති කරගනිමින් ඓතිහාසික මිහින්තලා රාජමහා විහාරස්ථාන පුදබිම කේන්ද්‍ර කරගෙන විශේෂ පුණ්‍යෝත්සවයක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. වළවාහැංගුණවැවේ ධම්මරතන හිමියන්ගේ අනුශාසකත්වයෙන් පැවැත්වුණු එම පින්කමේ දී මිහිඳු මහ සෑය එහි පෞරාණිකත්වය ආරක්ෂා වන පරිදි ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීමත් මිහින්තලා ධර්ම ශාලා මන්දිරයේ නව සංවර්ධන කටයුතු ආරම්භ කිරීමත් සිදු විය.

එම ධර්මශාලාව දකුණු ආසියාවේ විශාලම ධර්ම ශාලාව ලෙසට ඉදිකිරීමට කටයුතු කෙරිණි. එහි 5000 කට පමණ ධර්මය ශ්‍රවණය කළ හැකි ය. මෙවැනි ජාතික ආගමික කටයුතු මඟින් පොසොන් පසළොස්වක දින මිහින්තලාවට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේගෙන් ආගමට, දහමට, ජාතියට සිදුවූ මහා මෙහෙවර සැමරීමට කටයුතු කෙරිණි. ඒ වෙනුවෙන් පසුගිය වසරේදී මිහිඳු මහ රහතන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේ තැන්පත් ශෛලමය කරඬුව තැන්පත් කර ඇති ධාතු මන්දිරය ප්‍රතිසංස්කරණ කිරීම ආරම්භ විය.

අෂ්ඨඵල බෝධීන් වහන්සේ සංරක්ෂණය කිරීමට කටයුතු කළ අතර මිහින්තලේ රාජමහා විහාරස්ථාන පරිශ්‍රයේ පිහිටි චෛත්‍ය හා පුරාවිද්‍යාත්මක ස්ථාන සුරැකීමට හා සංරක්ෂණය කිරීමට පියවර ගත්හ.

මෙවන් ජාතික ආගමික කටයුතුවල නිරත වන වළවාහැංගුණවැවේ ධම්මරතන නාහිමියන්ගේ ඉදිරි අපේක්ෂා වන්නේ ද මිහින්තලේ රාජමහා විහාරස්ථානය මෙරට බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වන් පින්බර පුණ්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීමයි.

කවදත් මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාවට නොමඳව අනුශාසනා කරමින් කටයුතු කරන උන්වහන්සේ හා ලේක්හවුස් ආයතනය අතර ඇත්තේ නොබිඳිය හැකි අන්‍යොන්‍ය සම්බන්ධයකි. ලේක්හවුස් ආයතනයේ ආගමික කටයුතුවලට ද නිරන්තරයෙන් එක්වන ධම්මරතන නාහිමියෝ 'බුදුසරණ' පුවත්පත සඳහා ද ලිපි සපයමින් කටයුතු කරන්නේ මෙරට බෞද්ධ ජනතාව බුදු දහම කෙරෙහි තවදුරටත් යොමු කරවීමේ පරම අභිලාෂයෙනි.

මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවටම බුදුදහම පැතිරූ මිහින්තලා පුණ්‍යභූමියත්, ලොව ප්‍රථම අභයභූමිය වූ මිහින්තලා ප්‍රදේශයත් සුරැකීමට නිරන්තරයෙන් නායකත්වය දෙන, අනුශාසනා කරන, ඇප කැප වන, මිහින්තලේ රාජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නාහිමිපාණන් වහන්සේට සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් තව තවත් ඇප කැප වන්නට, නිරෝගීව සිය මෙහෙවර ඉටු කරන්නට ශක්තිය, ධෛර්ය ලැබේවා'යි බුදුසරණ ප්‍රාර්ථනාවයි.

**නිහාල් පී. අබේසිංහ**

**තුන් ලොවට ම එකම ශාස්තෘන් වහන්සේ වූ අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී ජේතවනාරාමයේ වැඩ වසන සමයෙහි ධනපාල නම් ප්‍රේතයා අරභයා මේ දේශනාව වදාළ සේක.**

# වැරැදි සිතිවිලි නිවැරැදි නොකිරීමේ විපාකය

**දන් දීමෙන් කිසි විපාකයක් නැහැ. සිල් රැකලා සංවර වෙලා ඇති වැඩේ මොකක් ද? කියලයි මම කිව්වේ. පැන් හල් වගේම පොදු යහපතට කළ උයන් වතු තිබුණා. පාපී සිතින් යුතුව ම ඒවා වනසලා දැම්මා. ඒදැඬුත් වැනසුවා. මම පින්දහම් නො කර පව් ම රැස්කරගෙන මනුස්ස ලෝකයෙන් චුත වුණා. ඉතින් මම ප්‍රේත ලෝකයේ ඉපදුණා. බඩගින්නෙන් පිපාසයෙන් පුදුම දුකක් විඳින්නේ.**

## ධනපාල ප්‍රේත වස්තුව

උන්වහන්සේ ලොව පහළ වීමට පෙර දසන්න නම් රටෙහි ඒරකච්ඡ නම් නුවර ධනපාල නම් සිටුවරයෙක් ජීවත් වුණා. ඔහු සැදැහැයෙන් තොර යි. තෙරුන් වහන්සේ කෙරෙහි පින් සිතක් ඇතිකර ගත්තේ නැහැ. ඉතා මසුරු යි. නැවත ඉපදීම හෝ කර්ම විපාක ඇතැයි විශ්වාසයක් ඔහුට තිබුණේ නැහැ. කුහක සිතින් වාසය කළ ඔහු කාලයාගේ ඇවෑමෙන් මරණයට පත්වුණා.

ඔහු මියගොස් වැලිකතරේ ප්‍රේතයකු ව උපන්නා. ඔහුට තල් කඳක් පමණ වූ සිරුරක් තිබුණේ. ඉපිල්ලී ගිය සම රළු යි. කෙස් විරූපි යි. බියකරු යි. දුර්වර්ණ යි. බෙහෙවින් විරූපි යි. බියකරු පෙනුමක් තිබුණේ. මේ ප්‍රේතයා සා පිපාසයෙන් දිය බිඳක් නො මැතිව කුසට අහරක් නැතිව බඩගින්නේ එහේ මෙහේ ඇවිදිමින් සිටියා.

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී මහා කරුණාවෙන් තුන් ලොවට දහම් දෙසමින් සැවැත්නුවර වැඩ වාසය කරන කල්හී සැවැත් නුවරවාසී වෙළෙන්දෝ ගැල් සියයක් බඩු පටවාගෙන උත්තර ප්‍රදේශයේ වෙළෙඳාමේ යන අතරේ එක්තරා වියළීගිය ගඟක් අසලදී ගැල් මුදා හැර විවේක සුවයෙන් පසුවුණා. සා පිපාසයෙන් ඇවිදිමින් සිටි ඒ ප්‍රේතයා මෙතැනට පැමිණ මේ වෙළෙඳුන්ට පෙනෙන ලෙස ඔවුන් ඉදිරියේ සිටියා.

ඒ වෙළෙන්දෝ මේ ප්‍රේතයා දැක පුදුම වුණා. ඔවුන් අසනවා

"ඔබේ ශරීරයේ නූල් පොටක් නැහැ. හරිම විරූපි යි. කෙට්ටු යි. නහරවැල් පෑදිලා තිබෙන්නේ. ඉළඇට ඉලිප්පිලා තිබෙනවා. මෙතැන සිටින ඔබ කවුද?"

"අනේ පින්වත්නි, මම මේ දුකේ වැටිලා ඉන්නේ මම ප්‍රේතයෙක්. මගේ අතීත පව් කෙරිලා තමයි මනුස්ස ලෝකයෙන් ප්‍රේත ලෝකයට ආවේ."

"දසන්න රට වැසියන්ගේ ඒරකච්ඡ කියලා ප්‍රසිද්ධ නගරයක් තිබෙනවා. මම කලින් ජීවිතයේ මනුස්ස ලෝකයේදී ඔය නගරයේ සිටුවරයෙක් වෙලා සිටියා. මා කවුරුත් දැන ගත්තේ ධනපාල සිටුවරයා කියල යි. මට අමු රන් විතරක් කරත්ත අසූවක් පුරවලා තිබුණා. රන්, රිදී තව සෑහෙන තරම් තිබුණා. වෛරෝඩි, මුතු, මැණික් ආදියත් හරියට තිබුණා. ඉතින් ඒ වගේ මහ ධනස්කන්ධයක් තිබුණ මට දන් දෙන්ට කැමැත්තක් ඇතිවුණේ ම නැහැ.

මම ආහාර අනුභව කළේ දොරවල් වසාගෙන. අහළපහළ යාචකයන්ට මා දකින්න ලැබෙන්න එපා කියලා. මට ශ්‍රද්ධාවක් තිබුණේ ම නැහැ. මම මසුරු යි. කෑදර යි. අනුන්ට හරියට අපහාස කරනවා. දන් දෙන උදවියට, පින් කරන අයට බොරු කරුණු කියලා බොහෝ දෙනෙක් එයින් වළක්වලා තිබෙනවා.

දන් දීමෙන් කිසි විපාකයක් නැහැ. සිල් රැකලා සංවර වෙලා ඇති වැඩේ මොකක් ද? කියලයි මම කිව්වේ. පැන් හල් වගේම පොදු යහපතට කළ උයන් වතු තිබුණා. පාපී සිතින් යුතුව ම ඒවා වනසලා දැම්මා. ඒදැඬුත් වැනසුවා. මම පින්දහම් නො කර පව් ම රැස්කරගෙන මනුස්ස ලෝකයෙන් චුත වුණා. ඉතින් මම ප්‍රේත ලෝකයේ ඉපදුණා. බඩගින්නෙන් පිපාසයෙන් පුදුම දුකක් විඳින්නේ. දැනට මම මියගොස් අවුරුදු පනස්පහක් වෙනවා මම මේ දක්වාම කාපු කෑමක් ගැන බීපු බීමක් ගැන දන්නෙවත් නැහැ. යමෙක් දන් නොදී වැළකී සිටීමෙන් වෙන්නේ විනාශය යි. යම් විනාශයක් ඇද්ද? ඒකයි දන් නොදී වැළකී සිටීම.

යමෙක් දන් නොදී වැළකී සිටීමක් ඇද්ද ඒකයි විනාශය කියන ඔය කාරණය පෙරේතයන් දන්නවා.

මම ඉස්සර හොඳට දේපළ වස්තුව තිබෙද්දී දීමෙන් වැළකිලා හිටියා. දන් දුන්නෙම නැහැ. දන් පැන් පූජාකර ගන්න ඕන කරන දේ මම ළඟ තිබෙද්දී මට පිහිටක් සලසා ගත්තේ නැහැ. දැන් මම පසුතැවි තැවී ඉන්නවා. පව්වල නම් විපාක ලැබුණා.

තව මාස හතරයි මට තිබෙන්නේ. ඊට පස්සේ මම මේ ප්‍රේත ලෝකෙන් චුත වෙනවා. එවිට භයානක වූ කටුක වූ අවීචි මහා නිරයට තමයි මම වැටෙන්නේ.

ඒ නිරයේ කොන් හතරක් තිබෙනවා. දොරවල් හතරක් තිබෙනවා. ඒවා කොටස් වශයෙන් ගානට බෙදිලයි තිබෙන්නේ. වටේට ම තිබෙන්නේ යකඩ පවුරක්. වහලට තිබෙන්නේත් යකඩ පියනක්.

ඒ අවීචි මහා නරකයේ ඇවිලෙන ගිනිදැල් හරිම සැරයි. ඒ යකඩ භූමියේ හැම තිස්සෙම යොදුන් සියයක් පුරාවට ගිනිදැල් පැතිරිලා තිබෙනවා. මට එහෙ ඉපදිලා දීර්ඝ කාලයක් දුක් විඳින්නට වෙනවා. කරපු පවෙහි විපාක තමයි. ඒ නිසා මම බොහෝ ශෝකයෙන් ඉන්නේ."

"පින්වත්නි, දැන් මෙතැන රැස් වූ ඔබ සියලු දෙනාට මම කියන්නේ ඔබට යහපතක් වේවා! හොර රහසේවත් එළිපිටවත් පව් කියන ජාතිය නම් කරන්න එපා. යම් හෙයකින් ඔබ ඉදිරියේදීවත් පව් කරනවා නම් දැනුත් පව් කරනවා නම් ඔබට ගැලවෙන්නට නම් ලැබෙන්නේ නැහැ. අහසට නැග පලා ගියත් විපාකවලින් ගැලවෙන්නට බැහැ.

අම්මාට හොඳට සලකන්න. පියාටත් හොඳට සලකන්න. කුල දෙටුවන්ට හොඳට සලක්නන. ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ටත් හොඳට සලකන්න. එහෙම කරලා ඔබ සුගතියේ උපදින්න."


ඒ වෙළෙන්දෝ ප්‍රේතයාගේ කතාව අසා බොහෝ සේ සංවේගයට පත්වුණා. ඔහුට අනුකම්පාවෙන් බඳුන්වලින් පැන් ගෙන ඔහුගේ මුවට වත්කළා. ඔවුන් මෙසේ බොහෝ වෙලාවක් පැන් වත් කළ ද ප්‍රේතයාගේ පාප කර්මය හේතුවෙන් පැන් යටි උගුරට බැස්සේ නැහැ. එවිට ප්‍රේතයා "ඔබලා මෙපමණ වේලාවක් වත්කරන ලද පැනින් එක් බිඳුවක්වත් ගිලුණේ නැහැ. මේ ප්‍රේත ලෝකයෙන් මිදීමක් නැහැ" යි කීවා.

ඒ වෙළෙන්දෝ තවත් සංවේගයට පත්ව "පිපාසය සංසිඳීමට කිසියම් මාර්ගයක් තිබේදැයි" අසා සිටියා.

මේ පාප කර්මය ගෙවීමට නම් තථාගතයන් වහන්සේට හෝ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයන්ට හෝ දන් දී මට පින් අනුමෝදන් කරන්නැයි ඉල්ලා සිටියා.

වෙළෙන්දෝ සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ඒ පුවත දන්වා බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට සත් දිනක් දන් දී ප්‍රේතයාට ඒ සියලු පින අනුමෝදන් කළා.

තථාගතයන් වහන්සේ මේ කතාව මුල්කරගෙන ධර්මය දේශනා කොට වදාළා.



නයනා නිල්මිණී



## සිරිසඟබෝ රජතුමා පෙරුම්දම් පිරූ

# අත්තනගල්ල ශ්‍රී අරහන්ත රාජමහා විහාරය

**බෝසත් ගුණැති සිරිසඟබෝ මහ රජතුමා මතු බුදුවීම පිණිස මඟියකු හට හිස දන් දෙමින් දාන පාරමිතාව පූරණය කළ අත්තනගල්ල පුදබිම කොළඹ නගරයට සැතපුම් විසි අටක් ඊසාන දෙසින් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල මැතිවරණ බල ප්‍රදේශයෙහි පිහිටා ඇත.**

රාජාංගනයේ හත්ථිකුච්ඡි විහාරය සිරිසඟබෝ රජතුමා හිස දන් දුන් ස්ථානය ලෙස ඇතැම් පුරාවිද්‍යාඥයන් අනුමාන කළ ද මහාවංසය, පූජාවලිය, පාලි හත්ථවනගල්ල විහාර වංසය, එළු අත්තනගලු වංසය, කඩඉම්පොත වැනි ලිඛිත මූලාශ්‍ර සහ තවත් සාධක බොහෝමයක් අනුව බහුතර විද්වතුන්ගේ විශ්වාසය එම ස්ථානය ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල බවයි.

මහියංගන රජ මහ වෙහෙරේ වැඩසිටි නන්ද මහ තෙරුන් ඇසුරෙහි හැදී වැඩුණු සංඝබෝධි හෙවත් සිරිසඟබෝ කුමරු සංඝතිස්ස රජතුමාගේ අභාවයෙන් පසු භික්ෂූන් වහන්සේලාගේ බලවත් ඉල්ලීම පිළිගෙන අනුරාධපුර රජ පැමිණ ධාර්මිකව රට පාලනය කරමින්, පැමිණි උවදුරු දුරලමින් රටවාසීන් සුබිතමුදිත කරවීය.

රාජ්‍ය පාලනය ගැන කළකිරී සිටි සිරිසඟබෝ රජතුමා රජකම අතහැර පෙරහන්කඩ පමණක් ගෙන දකුණු වාසල් දෙරින් පිටත්ව ගල්වල්රට හෙවත් මායාරට අත්තනගල්ල නම් ආරණ්‍යයට පැමිණ භාවනානුයෝගී ව විසීය.

එක්තරා දුගියකු මෙම ප්‍රදේශය හරහා යාමේ දී තමා රැගෙන ආ බත්මුල මෙම තවුසාට පිරිනමා අනුරාධපුරයේ රජතුමා සිරිසඟබෝ රජතුමාගේ හිස ගෙනැවිත් දෙන අයෙකුට මසුරන් දහසක් දෙන බැව් ප්‍රකට කොට ඇති බව දැන තමා සිරිසඟබෝ රජු බව පවසා හිස දන් දුනි. රජතුමා ගිය මග සොයමින් පැමිණි රජ බිසව රජතුමාගේ හිස සුන් දේහය දැක දුකට පත්ව කළුරිය කළා ය. අනුරාධපුරයේ අභිෂේක ලැබූ නව රජතුමා අත්තනගල්ලට පැමිණ සිරිසඟබෝ රජතුමාගේ සහ දේවියගේ ආදාහන කටයුතු සිදු කොට රන් කොතක් පැළඳවූ දෙමහල් වටදාගෙයක් තනවා දහස් ගණන් භික්ෂූන් වහන්සේලාට වාසය කළ හැකි අන්දමට නොයෙක් ප්‍රාසාද, සංඝාරාම, පිරුවන්, සක්මන් මළු, ධර්මශාලා ඇතුළු විහාරාංග තනවා විහාරයේ පැවැත්මට ගම්වර පූජාකොට දහසකට වැඩි පිරිවර සේවකයින් පත් කොට මතු රජ දරුවන් ද මෙලෙසම පැවැත්විය යුතු බවට රාජාඥවක් නිකුත් කළේ ය.

උපතිස්ස රජ දවස අත්තනගල්ලේ වෙහෙරවැසි මහ තෙරනමක් අබ්භෝකාසික ධුතාංගය පුරමින් විදර්ශනා වඩා පෙර සංසාරයේ ප්‍රාර්ථනා කළ

සිරිසඟබෝ රජු හිස දන් දුන් ස්ථානය

ආකාරයට මහ පොළොව ගුගුරවමින් රහත් ඵලයට පැමිණි කල ඒ ගැන පැහැදුණු රජතුමා පැමිණ දිව්‍යවිමානයක් බඳු වූ පස්මහල් සංඝාවාසයක් කරවා පිරිනැමීය. පසු කලෙක සොරුන් විසින් එම සංඝාවාසය විනාශ කරවූ කල මුගලන් රජතුමා තෙමහල් කොට නැවත තැනවීය.

දඹදෙණියේ රජ කළ තුන්වැනි විජයබාහු රජතුමා ඒ වන විට විනාශ වී තිබූ අත්තනගල්ල විහාරය පිළිසකර කරවා භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍ය පහසුකම් සකස් කළේ ය. තුන්වැනි විජයබාහු රජතුමාගේ අභාවයෙන් පසු ආදාහනය කරන ලද්දේ ද අත්තනගල්ල විහාරයේදී ය. තුන්වැනි විජයබාහු රජතුමාගේ පුත් වූ දෙවැනි පරාක්‍රමබාහු රජතුමා තම පිය රජු ආදාහනය කළ ස්ථානයේ දාගැබක් බඳවා පැරණි වටදාගෙය තෙමහල් කොට පිළිසකර කරවා දේවපතිරාජ ඇමතිවරයා මෙහෙයවමින් අගනා ප්‍රතිමා ගෘහයක් තැනවීය. පතිරාජ පිරුවන නමින් පිරුවනක් ආරම්භ කරවා බ්‍රාහ්මණ වංශික අනෝමදස්සි සංඝරාජයන් වහන්සේ වෙත පූජා කළේය. සිදත්සඟරාව රචනා කළ පතිරාජ පිරුවන්පති හිමියන් මෙම අනෝමදස්සි සංඝරාජ හිමියන් ලෙස සලකනු ලබයි.

මහනුවර යුගයේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍යවරයෙකු වූ ගොඩිගමුවේ හිමියෝ අත්තනගල්ල රජමහා විහාරයේ පුනර්ජීවනයට කටයුතු යෙදූහ. මහාරත්තාගල හිමි, ලෙවන්ගම සාරචන්ද හිමි, වල්පොල ඉන්දජෝති නාහිමි, නිවුන්හැල්ලේ සුමංගල නාහිමි, වල්පොල චන්දසාර නාහිමි, කෝන්ගොඩ පේමානන්ද නාහිමි, රාජකීය පණ්ඩිත සාහිත්‍යාචාර්ය වල්ගම්මුල්ලේ ප්‍රඥාරාම නාහිමි යන නාහිමිපාණන් වහන්සේලා විහාරාධිපති ධූරය හෙබවූ පසු වර්තමානයේ ආචාර්ය



විහාරාධිපති
ආචාර්ය පන්නිල ආනන්ද නාහිමි

පන්නිල ආනන්ද නාහිමිපාණන් වහන්සේ විහාරාධිපති ධූරය හොබවති. එසේම සංඝ රාජ හිමියන්ගේ ශිෂ්‍ය වූ මොරතොට ධම්මක්ඛන්ධ මහා නාහිමියන්ගේ ශිෂ්‍යයකු ලෙස සැලකෙන ඇකිරියගල මාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරෙන් අත්තනගල්ල පහළ පන්සල් පරපුර පැවත එන අතර පින්නවල සෝමානන්ද මාහිමියන් එහි විහාරාධිපතීත්වය හොබවති.

සියනෑ, හාපිටිගම්, හේවාගම්, අළුත්කුරු යන සිවු කෝරළයේ නායක පදවිය හෙවත් සීනාදී සිවු කෝරළයේ ප්‍රධාන සංඝ නායක පදවිය සහ මල්වතු මහාවිහාරයේ රාජපූජිත මංගලෝපෝසථාගාරයේ උපාධ්‍යාය පදවියක් අත්තනගල්ල රාජමහා විහාරාධිපති නාහිමිපාණන් වහන්සේලා වෙත මල්වතු මහාවිහාරයෙන් පුදදීම සුවිශේෂී සංසිද්ධියකි.

වර්ෂ 1850දී පිළිකුත්තුව රාජමහා විහාරාධිපති ඉඳුරුවේ සෝභිත සිරිධම්ම නාහිමියන් වෙත ප්‍රථමයෙන් පුද දුන් එම පදවිය දන්ගල්ල රාජමහා විහාරාධිපති දන්ගල්ලේ අත්ථදස්සි නාහිමියන්ගෙන් පසු වර්ෂ 1864දී අත්තනගල්ල රජමහා විහාරාධිපති වල්පොල ඉන්දජෝති හිමියන් සහ 1890දී නිවුන්හැල්ලේ සුමංගල නාහිමියන් වෙත පුද දී තිබේ. කොස්කඳවල සුනන්ද නාහිමි සහ වාරණ රජමහා විහාරාධිපති කොස්වින්නේ පඤ්ඤානන්ද නාහිමියන්ගෙන් පසු නැවතත් අත්තනගල්ල රාජමහා විහාරාධිපති ධූරීන වල්පොල චන්දසාර නාහිමි, කෝන්ගොඩ පේමානන්ද නාහිමි, වල්ගම්මුල්ලේ ප්‍රඥාරාම නාහිමි සහ පන්නිල ආනන්ද නාහිමියන් වෙත පිරිනමා ඇත.

අලවල පොත්ගුල් විහාරය, මාඉඹුල්කන්ද පුරාණ ගල්ලෙන් විහාරය, දඹුටුව පුරාණ විහාරය, කුරුවමුල්ල පුරාණ විහාරය, වල්ගම්මුල්ල බෝධිනන්දනාරාමය, යටියන ජයවර්ධනාරාමය, මාතලාන පුණ්‍යවර්ධනාරාමය, කඹුරාගල්ල බෝධිරුක්ඛාරාමය, හක්ගල්ල නාගවනාරාමය යන විහාරස්ථාන අත්තනගල්ල රජමහා විහාරස්ථානයේ අනුබද්ධ විහාරස්ථාන ලෙස පවතින අතර වත්මන් විහාරාධිපති නාහිමියන් ජාත්‍යන්තර ධර්ම ප්‍රචාරක මෙහෙවරෙහි යෙදෙමින් අමෙරිකාවේ හූස්ටන් බෞද්ධ විහාරය, තායිවානයේ ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානය ඇතුළු විහාරස්ථාන රාශියක් ආරම්භ කොට ඇත.

ලංකා ඉතිහාසයේ යුග ගණනාවක වැදගත් සිදුවීම් රාශියකට දායකත්වය සපයන ලද අත්තනගල්ල ශ්‍රී අරහන්ත රාජමහා විහාරය සැදැහැවතුන්ගේ නිබඳ වන්දනාමානයනට ලක් වන සුවිශේෂී පුදබිමකි.

දිමුතු පුන්සර කොළඹගේ



# කාවන්තිස්ස රජතුමාට අසාධ්‍යයි

දුටුගැමුණු මහ රජතුමා 35

**"අපගේ දේශ සීමා පුළුල් කරගන්නට අපට තිබුණු ලොකුම බාධාව දීඝාභය කුමාරයා. දැන් සටනක් නැතුවම උතුරු රාජධානියේ සීමාව පුළුල් කරගෙන තිබෙනවා. මේ නිසා ගැමුණු කුමාරයාට යුද්ධ කිරීමේ අදහස නවතා දමන්නට සිදුවේවි. අපට තවත් ඇත්තේ එක් අභියෝගයක් පමණයි. ඒ තිස්ස කුමාරයා අපට නතුකර ගැනීමයි. එය කරගත හැකිනම් දිගාමඩුලු රාජධානිය අපේ ප්‍රධාන රාජ්‍යයක් කරගත හැකියි. "**

"දීඝාභය කුමාරයා කියන ආකාරයට ගිරිනුවර රජකම් කරන්නේ ගැමුණු කුමාරයා නම් ඔහුට සෝමනුවර, කැලණිපුර සේරුනුවර, රජවරුන්ගේ සහය නොලැබෙන බව ස්ථිරයි. මේ තත්ත්වය අපට විශාල වාසියක්. ගිරිඅබා රජුගේත් එම ඥාතීන්ගේත් සහය ලබාගත හැකිද?"

"සිරිනාග තොපගේ අදහස අද පැවැත්වෙන යුද්ධ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන්න. ඒවා අපගේ ඉදිරි සැලසුම්වලට වැදගත් වේවි." කියමින් නැඟී සිටි එළාර රජු තම රාජධානියට මහත් ශක්තියක් වූ දීඝාභය කුමාරයාටත් අලුත් රහස් තොරතුරු රැසක් ගෙන ආ සිරිනාග සෙනෙවිතුමාටත් ස්තුති කළේය.

මහාසිව මාහිමිපාණන් වහන්සේ උදැසන තමන්ගේ සිසුන්ට සූත්‍ර පිටකයේ කොටස් කිහිපයක් උගන්වා ඒවා කටපාඩම් කිරීමට ඉඩ හැර එළියට පැමිණියේ බෝ ගස් සෙවනේ සිසිල විඳගන්නට ය. එම පරිසරයේ ශාන්ත බව මහා ස්වාමින් වහන්සේට ආධ්‍යාත්මික සුවයක් ගෙනදෙයි.

විහාරමහා දේවිය ගිලන්පස ගෙන එන්නටත් උපාසක උපාසිකාවන් වන්දනාමාන කිරීම සඳහා එන්නටත් තවත් පැයකටත් වඩා වැඩි කාලයක් ඇති නිසා මාහිමිපාණන් වහන්සේගේ විවේකයට බාධාවක් නොවීය. උන්වහන්සේ බෝගස් සෙවණට පැමිණ ගතවූයේ ස්වල්ප වේලාවකි. පරෙවියකු පැමිණ උන්වහන්සේගේ උරහිසේ වසා සිටියේ ය. උගේ පාදයේ හසුන්පතක් බැඳ තිබෙනු මාහිමිපාණෝ දුටුහ. ඌ තම උකුලට ගත් මාහිමියෝ හසුන්පත ලිහාගෙන තවු පිරිමැද ආදරය දක්වා බෝගස් පාමුල තැබූහ. සේවකයකුට කතා කර විළඳ මීපැණි තලියක් ගෙන්වා ඌ ඉදිරියෙන් තබන්නට කටයුතු කළේ ය. අනතුරුව වටපිට බලා කිසිවකු ළඟපාතක නැතිබව දැන තල්පත කියවන්නට වූහ.

තල්පත සිරිනාගගෙනි. විශේෂ රහස් තොරතුරු ඇතුළත් තල්පතක් එහි විය. ඔහු මුලින්ම එළාර රජු, මිත්‍ර සෙනෙවි, දීඝජන්තු ඇතුළු පිරිස විසින් තමන් පිළිගත් ආකාරයත් තමා ගැන විශ්වාසය තබා සෙනෙවි තනතුරක් පිරිනැමූ ආකාරයත් කෙටියෙන් සඳහන් කර තිබිණි. අනතුරුව රජරට රහස් තොරතුරු කිහිපයක් ද සඳහන් කර තිබිණි.

"දීඝාභය කුමාරයා දැන් එළාර රජුගේ මහා සෙනෙවියෙක්. විජිතපුර බලකොටුව භාර මහා සෙනෙවි ඔහුයි. මහවැලි දකුණු තිරයේ සෑම බලකොටුවකම සෙබළු තුන්දහසක් බැගින් රඳවා ටිකෙන් ටික දකුණු බිම අල්ලා ගන්නටත් තීරණය කර තිබෙනවා."

"දීඝාභය මහා සෙනෙවි මගින් තිස්ස කුමාරයා අවනත කර ගැනීමේ කූට උපක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. තිස්ස කුමාරයා අවනත කරගෙන ඔහුගේ පාලන ප්‍රදේශය අනුරාධපුර රාජධානියේ ප්‍රාන්ත රාජ්‍යයක් ලෙස පවත්වාගෙන යාමටත් එහි පාලකයා ලෙස තිස්ස කුමාරයා පත් කරන්නටත් රහසිගත යෝජනාවක් ඉදිරිපත් වී තිබෙනවා. ඒ තුළින් යුද්ධය පවතින අවස්ථාවක දී කැලණි, සේරු රාජ්‍යයන්ගෙන් දුටුගැමුණු කුමාරයාට සහාය නොලැබෙනු ඇතැයි ඔවුන් අපේක්ෂා කරනවා. කැලණි රාජ්‍ය අවනත කර ගැනීමට නොහැකි වුවහොත් හදිසි ආක්‍රමණයක් සිදුකර එම රාජ්‍යය යටත් කර ගැනීමට සැලසුම් කරනවා."

"දුටුගැමුණු කුමාරයා සටන් ආරම්භ කිරීමට පෙර රුහුණ ආක්‍රමණය කිරීමට එළාර රජුගේ කැමැත්තක් නැහැ. නමුත් දීඝාභය කුමරු පරිත්‍යාග කළ කඳවුරුවල බලය තහවුරු කර රුහුණේ ගම්මාන අල්ලාගනිමින් ක්‍රම ක්‍රමයෙන් මාගම රාජධානියට ළංවීමට සැලසුම් කර තිබෙනවා."

මාහිමියෝ දිගු තල්පත් තීරුව කියවා එය රෝල්කර සිය දබරැඟිල්ලෙහි රඳවා ගත්හ. පරෙවියාට මදක් රැඳෙන ලෙස සංඥා කරමින් සිරිනාගට පිළිතුරු තල්පතක් යවන අදහසින් කුටිය වෙතට ගියහ. සේවකයකු අමතා හැකි ඉක්මනින් වේළුසුමන, සුරනිමල සහ නන්දිමිත්‍ර මහා සෙනෙවිවරුන්ට තමා හමුවන ලෙසට දන්වන්නැයි පැවසූහ.

"තොප දන්වා එවූ කරුණු ඉතා වැදගත්. ඒ සෑම එකක් පිළිබඳවම මා සොයා බලනවා. කාවන්තිස්ස රජතුමාට ඉතා අසාද්‍යයි. තිස්ස කුමාරයා මෙහි පැමිණ සිටිනවා. ඉතා පරිස්සමින් කටයුතු කරන්න. මිත්‍ර සෙනෙවි සමග භේද ඇති කරගන්නට එපා. අවස්ථාවක් ලැබුණු විගස අපට තොරතුරු දන්වන්න."

තල්පත පරෙවියාගේ පයෙහි බැඳ ඌ අහසට යැවූ මාහිමියෝ සක්මනෙහි යෙදෙන්නට වූහ. මද වේලාවකට පසු ඈතින් අසරුවන් දෙදෙනෙක් එන හඬ ඇසිණි. ඒ සුරනිමල හා නන්දිමිත්‍ර බව හඳුනා ගැනිණි. වේළුසුමන නොපැමිණියේ ඇයිදැයි මාහිමියෝ සිතූහ. විහාර මලුව අබියස අසුන් මුදාහළ සෙනෙවිවරු මාහිමිපාණන් වහන්සේ වෙත පැමිණ දෙපා වැඳ බලා සිටියහ.

"තොපට කැඳවීමක් යැවූයේ ඉතා වැදගත් කරුණු කිහිපයක් දැනුම් දෙන්නටයි. මේ දැන් සිරිනාගගෙන් රහස් තල්පතක් ලැබුණා. වේළුසුමනත් පැමිණියා නම් හොඳයි."

"වේළුසුමන හදිසියේම ගිරිනුවර ගිහින්. සමහරවිට ගැමුණු කුමාරයා හමුවන්නට ගිය ගමනක් වෙන්නට පුළුවන්. රජතුමාට අසාධ්‍යයි."

"මමත් ත්‍රිපිටක තිස්ස මහා තෙරුන් වහන්සේත් අද පෙරවරුවේ රජ මාළිගයට ගියා. විහාරමහා දේවිය සමග කතා බස් කළා. ඇය මහත් වේදනාවකින් භයකින් පසුවන බව පෙනෙනවා. ඇයගේ මහා ප්‍රතාපවත් පෞරුෂය බිඳ වැටී ඇති බවක් පෙනෙනවා. සමහරවිට රජතුමා රෝගී වීමට තමාගේ ඇතැම් ක්‍රියාකලාපයන් මුල් වන්නට ඇතැයි පසුතැවෙනවා විය හැකියි."

රජතුමාගේ රෝගය සුව වෙන බවක් පෙනෙන්නේ නැහැ. එන්න එන්නම අසාධ්‍යය වන බවයි වෛද්‍යවරු පවසන්නේ. රජතුමාට අප හඳුනා ගන්නට තරම්වත් පියවි සිහියක් තිබුණේ නැහැ. අපේ සිත්වලට මහත් දුකක් දැනුණා. තිස්ස කුමාරයා මාලිගයේ සිටියේ නැහැ."

"ඊයේ හිමිදිරියේ ම තිස්ස කුමාරයා දිගාමඩුලු ගිහින්. අද එන බව දැන ගන්නට ලැබුණා. රජතුමා එතරම් අසාද්‍යය තත්වයක සිටියදී හදිසියේ ම ගියේ ඇයිද යන්න අපටත් ගැටලුවක්."

"ඒ ගැටලුවට පිළිතුර සිරිනාගගේ රහස් පතේ තියෙනවා. තිස්ස කුමාරයා පැමිණි විගසම මටත් ත්‍රිපිටක තිස්ස මාහිමිපාණන් වහන්සේටත් හමුවීමට සලස්වන්න. ඔහු නොමගට යන්නට පෙර නිසි මගට ගැනීමට වැඩපිළිවෙලක් යොදන්නට අවශ්‍යයි."

**අයන්ති විතාන**

# උකුවෙල සෞඛ්‍ය සේවකයන්ට සනීපාරක්ෂක ඇඳුම් කට්ටල

කොවිඩ් 19 රෝග මර්දන කටයුතුවල නියැළී සිටින උකුවෙල ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලවලට අදාළ සනීපාරක්ෂක ආරක්ෂිත ඇඳුම් කට්ටල තොගයක් පරිත්‍යාග කිරීම උකුවෙල ශාසනාරක්ෂක මණ්ඩලය විසින් පසුගියදා උකුවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ දී සිදු කරන ලදී. එම පරිත්‍යාගය සඳහා දායකත්වය ලබා දුන්නේ ලෝක තරුණ බෞද්ධ සංඝ සභාවේ මහ ලේකම් හා උකුවෙල ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති මුගුණුවෙල අනුරුද්ධ නා හිමියන් විසිනි.

- තාරක වික්‍රමසේකර



*අදාළ සනීපාරක්ෂක ආරක්ෂිත ඇඳුම් කට්ටල තොගය පරිත්‍යාග කිරීමෙන් පසුව සෞඛ්‍ය සේවකයකු රාජකාරී කටයුත්තක් සඳහා යෑමට එය සූදනම් කරගත් අයුරු. උකුවෙල ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී කළුන්දෑවේ චන්දසිරි හිමි සහ උකුවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඩබ්ලිව්. විජේරත්න මහතා ද මෙහි වෙති.*

බුදුසරණ



# නව තාක්ෂණයත් මුසු ව යළි ගොඩනැගෙන දීඝවාපී දාගැබ

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලචේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි දීඝවාපියට අම්පාර නගරයෙන් අක්කරෙයිපත්තු දක්වා දිවෙන මාර්ගයේ කි.මී. 6ක් පමණ ගමන් කළවිට හමුවන වරිපතන්චේන හන්දියෙන් හැරී කි.මී. 12ක් ගමන් කිරීමෙන් පිවිසිය හැකිය. නැගෙනහිර පළාතේ විශාලතම ස්තූපය හා විශාලත්වයෙන් ලංකාවේ හතරවැනි තැන ගන්නා ස්තූපය ලෙස සැලකෙන්නේ දීඝවාපී දාගැබයි. ඉපැරැණි රෝහණ රාජධානියට අයත්ව පැවැති දීඝවාපිය දිග් වූ වැව, දීඝ වාපිය, දිගා වැව ලෙස ජනප්‍රවාදයේ එයි. වංශකතා සාධක ප්‍රමුඛ ලේඛනගත මූලාශ්‍ර සොයා යාමේදී දිගා වැව, දීඝවාපී මණ්ඩල, දීඝ වාපිරට්ට, දිගාමඬුලු, දිගාවැෘ, දිගාවැෘ මඩල, දිගමඩුල්ල යන නාමයන් හඳුනාගත හැකිවේ.

දීපවංශයට අනුව බුදුන් වහන්සේ තෙවැනි වර ලක්දිව කැලණි පුරවරයට වැඩම කරන ලද අවස්ථාවේ කැලණිය, සමන්තකූටය හා දිවා ගුහාව යන ස්ථානයන් හි සමවැදී පසුව දිගාවැවට වැඩම කළ බව සඳහන්වේ. මහාවංශයේ ඒ පිළිබඳව සඳහන් වන්නේ "සර්වඥ තෙම එතන්හි ධර්මදේශනා කොට අහසට නැඟී වැඩ සමන්කුළු මතුයෙහි පා සටහන් දැක්වූ සේක. සංඝයා සහිතවූ සේක් ඒ පර්වත පාදයෙහි සැප සේ දිවා විහරණය කොට දිගාවැවට වැඩිසේක. ලෝකස්වාමි තෙම සංඝයා සමඟ වූ සේක. එහි චෛත්‍ය ස්ථානයෙහි වැඩ හිඳ ස්ථානය ගෞරවයට පැමිණීම පිණිස සමාධියට සමවන්සේක." සද්ධර්මාලංකාරයේ දැක්වෙන්නේ "සර්වඥයන් වහන්සේ භගවා ලෙන සිට.....රුහුණු ජනපදයට වැඩ දීඝනඛ චෛත්‍ය පිහිටවන්නා වූ ස්ථානයේ සපිරිවරින් සමාප්තියට සමවැද මොහොතක් වැඩහුන් සේක" යනුවෙනි.

විජය කුමාරයා සමඟ මෙරටට පැමිණි කුමාරවරුන් ගණනාවක් විය. ඔවුන් මෙරට නන්දෙස සිය නාමයන්ගෙන් ජනාවාස පිහිටුවාගෙන ඇත. අනුරාධ අනුරාධ ග්‍රාමය ද, උපතිස්ස උපතිස්ස ග්‍රාමය ද, උරුවේල උරුවේල ග්‍රාමය ද, විජිත, විජිත ග්‍රාමය ද, රෝහණ රෝහණ ග්‍රාමය ද පිහිටුවාගෙන ඇත. විජය රජුගෙන් පසුව රාජ්‍යත්වය පත් පණ්ඩුවාසදේව රජුගේ බිසව වූ භද්දකච්චායනා කුමරිය සමග ඇයගේ සොහොයුරන් අට දෙනෙකු ද මෙරටට පැමිණෙන ලද අතර, ඉන් දීඝායු කුමාරයා විසින් දීඝායුගාම පිහිටුවා තිබේ. මෙම දීඝායුග්‍රාමය දීඝවාපිය බවට හඳුනාගෙන ඇත. මහාවංශයට අනුව කාවන්තිස්ස රජතුමා තම පුත්‍රයා වූ සද්ධාතිස්ස කුමාරයා කෘෂි කාර්මික සංවර්ධනය උදෙසා යවනු ලැබූයේ හා පිය රජුගේ මරණින් පසු සද්ධාතිස්ස කුමරායා තම මව වූ විහාරමහා දේවිය රැගෙන යන්නේත් මෙම දීඝවාපී ප්‍රදේශයට ම බව පෙනේ.

එසේම දුටුගැමුණු රජුගේ රාජත්වයේ දී සොයුරු සද්ධාතිස්ස කුමාරයා කෘෂිකාර්මික කටයුතු උදෙසා යවනු ලැබුවේ ද මෙම ප්‍රදේශයට ම වේ.

දීඝවාපී ස්තූපය කුමන රාජ සමයක ඉදිකර තිබෙන්නේ ද යන්න සොයා බැලීමේ දී මහාවංශයේ එන පුවතක් සැලකීම වටී. එහි සඳහන් වන්නේ සද්ධාතිස්ස රජු "දිගා වැෘ වෙහෙරද සෑයක් සහිත කොට කරවීය. ඒ සෑය වසා එලන සත් රුවන් ඇමුණු සැට්ටයක් කරවන ලදි" ලෙස ය. එසේම දඹදෙණිය යුගයේ විරචිත පූජාවලියේද මෙම සිදුවීම පිළිබඳ සඳහනක් එන අතර එහි සඳහන් වන්නේ සද්ධාතිස්ස රජු විසින් දිගනකාදි වෙහෙර කරවූ බවයි.

දීඝවාපි ස්තූපයේ බටහිර වාහල්කඩින් හමුවූ රනින් කරන ලද ධාතු කරඬුවක තිබී හමුවූ රන්පතක ලියා තිබූයේ "නක මහරජුගේ පුත්‍ර මළිතිස රජුගේ රන් දාගැබයි" යන්නයි. මළිතිස යනු කණිට්ටතිස්ස (ක්‍රි.ව.164-192) රජුය. කණිට්ටතිස්ස රජු මහා පරිමාණයෙන් ස්තූප ප්‍රතිසංස්කරණය උදෙසා කැපවී ඇති අතර පුරාණ රෝහණ දේශයටම අයත්ව පිහිටා ඇති වර්තමාන නැගෙනහිර පළාතේ පිහිටි විශාලත්වයෙන් දීඝවාපි ස්තූපයට පමණක් දෙවැනි දාගැබවන නීලගිරි ස්තූපය ද මෙම රජු විසින් ප්‍රතිසංස්කරණය කර ඇති බවට සාධක වේ.



පොළොන්නරු රාජ්‍ය සමයේ මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේදී (ක්‍රි.ව.1153-1180) දීඝවාපී ප්‍රදේශය මානාභරණ රජු හා සුගලා බිසවගේ බල ප්‍රදේශයක් ලෙස පැවැති බව මහාවංශයේ සඳහන් වේ. දීඝවාපියෙහි ඇතිවූ කැරලි මර්ධනයට "එකල්හි මහ බලැති සියලු ඇමැතියෝ ද ප්‍රධානීහු ද දිගා වැෘ මඩුලු රට ගන්නට නික්මුණෝ......"ලෙස එහි සඳහන්ව ඇත. මෙකල දිගාමඩුල්ල ප්‍රබල රජ්‍යයක්ව පැවැතීමෙන් පැහැදිලි වන්නේ දීඝවාපි විහාරයද දියුණු මට්ටමක පවතින්නට ඇති බව ය.

මහනුවර රාජ සමයේදී රචිත නම් පොත හෙවත් විහාර අස්නේදී නබා වෙහෙර සඳහන් ව ඇත්තේ මෙම විහාරය යි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු මෙම නබ චේතිය නම් ස්ථානයට පැමිණි බව මහාවංශයේ සඳහන් වේ. එසේම උඩරට සෙනරත් රජු ද මෙම විහාරය වන්දනා කිරීමට පැමිණ ඇත. කන්ද උඩරට රාජධානියෙන් මෙරට රාජ්‍යත්වය අවසන්වීමෙන් අනතුරුව දීඝවාපි විහාරය ද අභාවයට යන අතර වනගතව පැවැති මෙම විහාරය නැවත සොයාගනු ලබන්නේ 1810 වර්ෂයේ දී මඩකලපු දිස්ත්‍රික්කය භාර දිසාපති සෝවිස් නම් ඉංග්‍රීසි පරිපාලන නිලධාරියා විසිනි.

ඔහුගේ නියෝගය අනුව මෙම ස්තූපය කැණීම් කර තිබේ. එය හුදෙක් පුරාවිද්‍යා කැණීමක් නො වන අතර, එමනිසා චෛත්‍යයට වූ හානිය සුලුපටු නොවේ. එයින් පිටතට ගන්නා ලද ගඩොල් සහ කළු ගල් කණු වීරඅඩි අමුණ වැනි වාරිමාර්ග කටයුතු සඳහා රැගෙන ගිය බවට වාර්තාවේ. 1916 වර්ෂයේ දී ගොඩකුඹුරේ රේවත හිමියන් මෙම ස්ථානයට වැඩමකර කුඩා ආවාස ගෘහයක් තනාගනිමින් විහාරයේ උන්නතිය උදෙසා මැදිහත් වී තිබේ. මෙම විහාරස්ථානය අතීතයේදී වර්ග කිලෝමීටර 64ක් ප්‍රදේශයක් පුරා පැතිර තිබී ඇති අතර, ප්‍රධානම අංගය වූයේ ස්තූපය යි. වර්තමානයේ මෙම ස්තූපයේ ඉහළ කොටස් දක්නට නො ලැබෙන අතර වර්තමාන උස මීටර 22.41කි.

බෞද්ධ විශ්වාසයට අනුව මෙම දාගැබේ නිදන් කර ඇත්තේ බුදුන් වහන්සේගේ නිය ධාතූන් වහන්සේ යි.

වර්තමානයේ දීඝවාපී ස්තූපය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම මත ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ප්‍රතිසංස්කරණය කරමින් පවතී. මෙහි කොටස් කිහිපයක් ඉදිරියේදීත් කැණීම් කිරීමට යෝජිත අතර ඊට සමගාමීව ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදුවේ.

නැගෙනහිර පළාතේ විශාලතම ස්තූපය වන මෙම ස්තූපය අනුරාධපුර ජේතවන, අභයගිරි ස්තූප සංරක්ෂණයන්ට වඩා වෙනස් මඟක් ගනිමින් වන්දනාමාන කළ හැකි පරිදි සම්පූර්ණයෙන් ම ඉදිකර සුදුහුනු පිරියම් කිරීමට යෝජිත ය. එනම් රුවන්වැලි මහා සෑයේ මෙන් වැඩ නිම කිරීමට සැලසුම් කර ඇත. මෙම ස්තූපය ප්‍රංතිසංස්කරණයේ දී ඒ සඳහා පැරැණි බදාමයට සමාන ලෙස යමින් විශේෂිත බදාමයක් භාවිත කරනු ලබයි.

අළු හුණු 1, උළු කුඩු 2, හුඹස් මැටි 2ක් හා දහයියා අළු 1ක් ලෙස අනුපාතයට ගෙන මෙම බදාමය සකස් කරගනු ලබයි. චෛත්‍යයේ කටයුතු සඳහා අවශ්‍ය ගඩොල් උළු සංස්ථාව මගින් වර්තමානය වනවිට සපයා ගනී. මේ වනවිට පේසා වළලු ත්‍රිත්වයේ අඩක පමණ වැඩ අවසන් කර ඇති අතර ගර්භයේ අඩි 2.5ක් උසට වැඩ නිමකර තවත් අඩි 2.5ක් උස ප්‍රමාණයක් වැඩ අවසන් කිරීමට නියමිත ය.

වර්තමාන ප්‍රතිසංස්කරණවල දී ස්තූපයේ ගර්භය සකස් කිරීමට සුවිශේෂී තාක්ෂණයක් උපයෝගී කරගෙන ඇති අතර එහිදී ගර්භයේ අඩි 2.5ක් උසට එක් ගඩොල් වටයක් බැඳ එම ගඩොල් වරිය මත සුවිශේෂී දැලක් බදාම සමඟ යොදා නැවත අඩි 2.5ක් උසට ගඩොල් වරියක් බඳිනු ලබයි. මෙම ක්‍රමය ගර්භයේ වැඩ අවසන් වන තෙක් භාවිත කිරීමට සැලසුම් කර ඇත.

සම්පූර්ණයෙන් ම ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම ස්තූපය උසින් අඩි 256ක් වන ලෙසට සැලසුම් කර තිබේ. මෙරට පූජනීයම ස්තූපය ලෙස සැලකෙන රුවන්වැලි මහා සෑයේ උස අඩි 338ක් වන අතර" එම ස්තූපයට වඩා නැවත ප්‍රතිසංස්කරණයෙන් පසු දීඝවාපි ස්තූපය අඩි 82ක උසින් අඩුවේ. රුවන්වැලි මහා සෑයේ විෂ්කම්භය අඩි 370ක් වන අතර දීඝවාපි ස්තූපයේ පහළම පේසාවේ විෂ්කම්භය අඩි 239ක් ද, දෙවන පේසාවේ විශ්කම්භය අඩි 229ක් ද හා ඉහළින්ම වන තෙවන පේසාවේ විෂ්කම්භය අඩි 220ක් පමණ ද වේ.

එම තෙවන හා ඉහළම පේසාව මත ගොඩනැගෙන ස්තූප ගර්භයේ පාදමේ විෂ්කම්භය අඩි 212ක් පමණ වේ.

හතැරැස් කොටුව හා දේවතා කොටුව අඩි 24 බැගින් වන සමාන උසකින් ගොඩනැඟීමට නියමිත ය. පේසා වළලු ත්‍රිත්වය අඩි 12ක් පමණ උසකින් ද, ගර්භය කොටස අඩි 91ක් පමණ ද, කොත්කැරැල්ල අඩි 60ක් පමණ ද උසකින් සමන්විත වනු ඇත.

සුවිශේෂී තාක්ෂණයත් සමඟ නැවත ගොඩනැගෙමින් පවතින දීඝවාපි ස්තූපය තවත් වර්ෂ කිහිපයකින් බෞද්ධයන්ගේ නොමද වන්දනාවට ලක්වන ස්වේත වර්ණයෙන් දිලෙන දාගැබක් ලෙස දායාද වනු නියත ය. අපගේ ප්‍රාර්ථනය ද එයයි.

කේ.උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

